# සැඳෑව
## සந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2015 ජූලි/ අගෝස්තු.



වෙබ් අඩවිය ඃ www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක ඃ QD/04/News/2015 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.




# හෙට ඔබටත් උරුම තැනක්.....

**සු**රලෝකේ හිටපු දෙවිවරු කොට්ඨාසයක් මේ දවස් වල ඉන්දියන් සාගරේ මුතු ඇටේ උඩට ගොඩ බැහැල හැම තැනම සැරිසරනව වගේ පේනව. ජීවිත කාලයක් තුළ ලබා ගත නොහැකි, ලඟාකර ගත නොහැකි ජීවත්වීමේ මූලික අයිතීන් කීපයක් බෙදල දෙන්න ඔන්න මෙන්න කියල වගේ තියෙනව. මේ වගේ සුරතාන්ත කථා බහ ජීවිත කාලයක්ම අහපු, විඳපු ජීවීන් කොටසක් හැටියට යළිත් උත්කර්ශයට පත්වෙලා සිහින බිජු අතරෙ සැරිසරනව ද කියල යළි යළිත් සිතා බැලීමට කාලයයි මේ.

උදේ හවස දත් මැදල විසිකරල දමන දැහැටි කූරු හෝ බුරුසු කොට වගේ සේවා ස්ථානයෙන් කල්පිරී, පරිනත වූවන් හෙවත් විශ්‍රාමිකයන් පිළිබඳව ප්‍රවර්තනිකයන් හිතන පතන හැටි මිත්‍යාවක් නෙමෙයි.

**"විශ්‍රාමිකයො.... නැත්නම් පැන්ෂන් කාරයො මොකක්ද ආයතනයකට දෙන දායකත්වය ? ඒ ගොල්ලන්ට මොකටද වැඩි වැටුප් ? ඒ මිනිස්සුන්ගෙ කාලෙ ඉවරයි.... දැන් අපේ කාලෙ......"**යි කියල ප්‍රකාශ කරන එකට තමයි. දැහැටි කූරු නොහොත් බුරුසු කොට, තියරිය කියන්නෙ. මහ බැංකු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුපේ පවතින විශමතාවයන් ඉවත්කර එය යාවත්කාලීන කර ගැනීමට දැරූ උත්සාහයන් හමුවේ සංගමය අත්වින්දේ දැහැටි කූරු න්‍යායයි. වසර ගණනාවක් තිස්සේ දරණ ලද ප්‍රයත්නයට සුලං පොදක් වැදුනේ පසුගිය සතියේදීය. බාලගිරි දෝසයක් ගැන අප සංගමය ඔබට කීවේ ඊටත් සති කීහිපයකට ඉහතදීය.

විශ්‍රාමිකයන් හට වැටුප් විෂමතාවන් නැත. රජයෙන් එවැනි වැඩි කරීමක් නැතැයි ඉහලින් ප්‍රකාශ කෙරුන නමුත්, රජය විසින් රාජ්‍ය සේවයේ විශ්‍රාමික වැටුප් විෂමතාව වහාම ඉවත් කිරීමට පියවර ගෙන තිබීම බොරුවක් නොවේ. ඒ පරමාදර්ශය අනුවවත් අපට වැළඳී ඇති බාලගිරි දෝසය ඇකී මැකී යනු ඇතැයි විශ්වාසයක් දහසකට අධික අප සාමාජිකයන් තුළ නිවි නිවී දැල්වේ. උළුවස්සේ ලියා ඇති 'අද නෙමෙයි හෙට' යි යන වැකිය Delete කිරීමට කවදා නම් හැකිවේදැයි ඇඟිලි ගනිමින් බලා ඉන්නව.

කෙසේ නමුත් පසුගිය මාස අග දී කිසියම් කොළපාට එලියක් දැල්වූ බව පේනව. වසර ගණනකින් බාලගිරි දෝසය දුරු කිරීම සඳහා ඖෂධ පොදක් ලැබුණ. එය උළුවස්සේ ඇති වාක්‍යය  Delete කිරීමට තරම් බලවත් එකක් නොවුනත් අතුරු ඖෂධ පොදක්  බව ප්‍රකාශ කළා. මේ ඖෂධ පොදවත් ලැබුණ එක ගැන සතුට පලකරමින් අපේ ජ්‍යෙෂ්ඨ සාමාජික සාමාජිකාවෝ තුති පුදකරනව.
වත්මන විධායක කමිටුවට, මානව සම්පත් දෙපාර්තමේන්තුවට, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවට, සහකාර අධිපතිවරන්ට, නියෝජ්‍ය අධිපතිවරුන්ට, නව අධිපතිතුමාට හා මෙම තීරණය එළඹි රජයටත් කෘතඥතාව පුද කරන බව සත්‍යයක්. ඒ වගේම මෙය අගේ නොකරන, කෘතඥතාව එලකිරීම වෙනුවට ද්වේශය පළකරන අයත් ඉන්නව. ගිනිකන වැටුනහම එහෙම තමයි.

ඒ හැමෝම වෙනුවෙන් අප විධායක කමිටුව නව අධිපතිතුමාටත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයටත් කෘතවේදී වීමට අමතක කරන්නේ නැහැ.

අතුරු ඖෂධය (දීමනාව) අභිබවා යමින් රෝගය නිට්ටාවටම සුවකරන පූර්ණ ඖෂධය කෙරෙහි වහ වහා යොමුවීමට කාලයයි මේ. උළුවස්සේ ඇති වාක්‍යය අකා මකා දැමීමට හැකිවනු නොඅනුමානයි. ඒ සඳහා නව අධිපතිතුමාගේ අවධානය සඳහා මෙහෙම කිව හැකියි. **'සම්පූර්ණයෙන් ගෙවා අවසන් නොකළ ණයත්, සහමුලින්ම නිවා නොදැමූ ගින්නත්, මුළුමනින්ම නැති නොකළ සතුරාත් නැවත ටික ටික බලවත් වේ.'** කියල පඬිවරු කියල තියෙනවා.

| | |
|---|---|
| **පාන්දරට දත්ටික මැදලා** | **දමන** |
| **තැළුණු බුරුසු කොටයක් විලසින්** | **මනින** |
| **මෙහෙ කළ එදා දෙටු පුරවැසි දනන්** | **ගුණ** |
| **පා ගනු හොඳද හෙට ඔබටත් උරුම** | **තැන?** |

**එක්දින චාරිකාව පිළිබඳ මුද්‍රිත පත්‍රිකාවක් සඟරාව ඇතුලත ඇති බව අවධාරණය කරමු.**

**-සංස්කාරක-**

# මට හිතෙන හැටි !

**කැ**ලේ රජා සිංහයාය. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්වලදී හරස් ප්‍රශ්න දමා ගසන පොඩි එවුන් මෙන්, කථාන්තර කියූ ආච්චිලා-සීයලා කොරවෙන දේ විමසීමෙන් තොරව සිංහයා වීරයෙක් කොට සැලකූ ළමා අවධියක් අපට තිබිණ.

සිංහයා කැලයද, එහි නිවැසි සියලු සතුන්ගේද ආරක්ෂකයා වෙයි. භාරකාරයා වෙයි. ලපැටි වියෙන් තුරුණු වියට ද මැදිවියට ද එළැඹුන තැන් පටන් සතා සීපාවාගේ ජවයෙන් පිරී තිබූ සටන්කාමී ඕජෝ ගුණය ක්‍රමයෙන් දුබල වෙයි. හීන වෙයි. මහලු වියට එළඹෙන්නට පිය ඔසොවනවාත් සමගම තවකෙකුගේ උදව්ව, හව්හරණය අවැසි වෙයි. තම වර්ගයේම එකකු විසින් දඩයම් කර ගෙන එනු ලබන දෙයකින් කුස පුරවා ගනී.

සතා, සීපාවුන් පවා එසේ එකිනෙකට උදව්වනවා නම් මනුසත් සමාජයේ එවැනි හුරුපුරුදුකම් ඊටත් වඩා ඉහලින් තිබිය යුතු නොවේද?

මනුසත් සමාජයේ තුරුණු වියට එළඹ රැකිරක්ෂාදිය කෙරෙමින් විවාපත් වෙමින් දරු මුණුපුරන් රක්ෂා කෙරෙමින් කුටුම්බ ජීවිතයේ දහසකුත් එකක් අතෝරයන්ට අනවරතයෙන් මුහුණදෙමින් සංකීර්ණ සමාජයෙක හැලහැප්පෙමින් ජීවත්වන අප නොදැනුවත්වම විශ්‍රාමය ලබාගත යුතු වයසට එළැඹෙනුයේ ජීවිතයෙක හුදු පැවැත්මේ ඇති අස්තිර භාවයම දහසකුත් වරක් හිත පතුලට නින්නාද කරවමිනි.

විශ්‍රාමික දිවියේ ඔවුන්ගේ සැනසිල්ල දුවා දරුවන්ගේ යහපත් ජීවන චර්යාවන් දකිමින් අසමින් අධ්‍යාත්මික සුවයට අරුතක් එක්කර ගැනීමේ අරමුණින් යෝණිසෝමනසිකාරයෙන් යුතු වූ දැක්මත් අනුව ජීවිතය හැඩගස්වා ගැනීමෙනි.

මේ සියලු දෙය යහපත් වූ අරමුණින් කර ගැනීමට ඔවුන්ට උදව් දෙනුයේ මාසික විශ්‍රාම වැටුප බව රහසක් නොවේ.

පවතින ජීවන අරගලයේ රුදුරු දැති මුවහතට හසුවී කැපී කෙටී කුඩු වී යන සොච්චම් විශ්‍රාම වැටුප ඉදිරියේ සපුරා ගත යුතු දහසකුත් එකක් උවමනාවන් තිබිය දී ඉල්ලුමට සරිලන පරිදි වැඩිවිය යුතු සැපයුම ඒ පිළිබඳව හොඳින්ම දත් වෘත්තිකයන්ගේ බාධා කිරීම් ඉදිරියේ නොලැබී යාමෙන් විශ්‍රාමිකයා පත්වන තත්ත්වය අමුතුවෙන් කිවයුතු නොවේ. විග්‍රහ කළ යුතු නොවේ.


අප නිරතව සිටින සේවයෙන් විශ්‍රාම ලබා බැහැර යන බව අමතක කර දමා, සේවයේ නිරතව සිටින අවස්ථාවේදී තමන්ගේ පතට පමණක් ලොකුම හැඳිවලින් බෙදාගෙන විශ්‍රාමිකයන්ට කන් හැන්දෙන් බෙදා, එසේ කළේ ද තමන් පමණකැයි පංපෝරි ගසා අඬහැර පෑම මනුසත් ගුණයක් නොවේ.

ධීර වීර ගුණයෙන් යුත් සිංහයෝ තනකොළ නොකති. එසේම ද විශ්‍රාම සුවයෙන් සිටින මහලු වියට පත් දත් හැලී ගිය සිංහයන්ට සිංහධේනුවන්ට බලහත්කාරයෙන් තනකොල ද නොකවති.

කැලේ රජාවන සිංහයාට බාසුරු යැයි නමක් පටබැඳී ඇත්තේද ශූර වීර වූ බාහු යුග්මයකින් යුතු හෙයිනි.

එවැනි වූ බාහු බලයක් යොදා ජීවිතයේ සැඳෑසමය ගත කරණ, බාහු බලය පිරිහී ගිය තමන්ගේම වර්ගයේ අයට ගොදුරු සරි කර දීමට කටයුතු නොකරන්නේ නම් ඔවුන්ට දෙවියන්ගේ පිහිට හැර අන් සරණක් නැති !.

**ජගත් කාරියවසම් (1215)**
**038 - 2236643**
**077 - 9507184**



# මහ බැංකු විශ්‍රාමිකයාට 2015 වසර ..........?



**පසුගිය වැටුප් වැඩි කිරීම් අවස්ථා 7 කදී බැංකු සේවකයින්ගේ සහ විශ්‍රාමිකයින්ගේ මූලික වැටුප් වැඩි වීමේ රටාව මෙසේ සටහන් කළ හැකිය.**

| වර්ෂය | මහ බැංකු සේවක වැඩිවීම | මූලික වැටුප් | මහ බැංකුවේ විශ්‍රාමික මූලික වැටුප් වැඩිවීම | | |
|---|---|---|---|---|---|
| | මහ බැංකුව පහළම ශ්‍රේණිය වන සු/සේ.1 | මහ බැංකුවේ ඉහළම ශ්‍රේණිය වන නියෝජ්‍ය අධිපති | 1980 ට පෙර විශ්‍රාමික | 1980 ට පසු විශ්‍රාමික | |
| 1994 | 258.18% | 72.06% | 35% | 15% | |
| 1997 | 43.40% | 18.35% | 15% | 10% | |
| 2000 | 33.27% | 33.32% | 15% | 10% | |
| 2003 | 61.62% | 45.69% | 20% | 20% | |
| 2006 | 47.08% | 65.05% | 1991 ට පෙර විශ්‍රාමික 12.5% | 1991 ට පසු විශ්‍රාමික 5% | |
| 2009 | 37.5% | 39% | 2000 ට පෙර විශ්‍රාමික 15% | 2000 ට පසු විශ්‍රාමික 5% | |
| 2012 | 30.0% | 40.04% | 1990 ට පෙර විශ්‍රාමික 20% | 1990 - 2000 දක්වා 15% | 2000 ට පසු විශ්‍රාමික 5% |

එසේම උක්ත කරුණු ඇසුරෙන් පහත සඳහන් නිගමන වලට ද එළඹිය හැකිය.

**1**. 2006 වර්ෂයට පෙර මහ බැංකු සේවකයින්ට, අඩු වැටුප් ලබන අයට වැඩි ප්‍රතිශතයකිනුත්, වැඩි වැටුප් ලබන අයට අඩු ප්‍රතිශතයකිනුත් වැටුප් වැඩි වන ආකාරයට, සුළු සේවක 1 ශ්‍රේණියේ සිට නියෝජ්‍ය අධිපති දක්වා වැටුප් වැඩිවීමේ ප්‍රතිශතය ක්‍රමයෙන් අඩු වන ආකාරයට වැටුප් වැඩි කර, විශ්‍රාමිකයාට ද සාමාන්‍යයෙන් සාධාරණ ප්‍රතිශතයකින් විශ්‍රාම වැටුප් වැඩි කිරීම මහ බැංකුවේ ප්‍රතිපත්තිය වීම.

නමුත් 2006 වර්ෂයේ සිට මෙම ක්‍රමය උඩුයටිකුරු කර අඩු වැටුප් ලබන අයට අඩු ප්‍රතිශයකිනුත්, වැඩි වැටුප් ලබන අයට වැඩි ප්‍රතිශයකිනුත් වැඩි වන ආකාරයට මහ බැංකු සේවකයන්ට ඉතා ඉහළ වැටුප් වැඩි වීමක් ලබා දෙමින් විශ්‍රාමිකයාට ඉතා සුළු විශ්‍රාම වැටුප් වැඩිවීමක් ලබාදීම මහ බැංකුවේ ප්‍රතිපත්තිය වී තිබීම.

**2**. වර්ෂ 2006 ට පෙර කිසි කලෙක 5% ක් වැනි ඉතා සුළු විශ්‍රාම වැටුප් වැඩි වීමක් මහ බැංකුව විසින් සිදු කර නොතිබීම.

**3**. 2006 වර්ෂයට පෙර මහ බැංකුව විශ්‍රාම වැටුප් වැඩි කර ඇති ආකාරය දෙන බලන විට, අවම වශයෙන් වර්ෂ 2006 දී 1991 ට පෙර විශ්‍රාමිකයන්ට 30%කින් පමණ ද, 1991 ට පසු විශ්‍රාමිකයින්ට 25% කින් පමණ ද, විශ්‍රාම වැටුප වැඩි විය යුතුය. වර්ෂ 2009 දී 2000 ට පෙර විශ්‍රාමිකයන්ට 20% කින් පමණ ද 2000 ට පසු විශ්‍රාමිකයනට 15% පමණ ද වැඩි විය යුතුය. 2012 වර්ෂයේ දී 1990 ට පෙර විශ්‍රාමිකයනට 20% කින් පමණද, වර්ෂ 1990-2000 අතර විශ්‍රාමිකයනට 15 කින් පමණද 2000 ට පසු විශ්‍රාමිකයනට 10% කින් පමණද, අවම වශයෙන් විශ්‍රාම වැටුප් වැඩි විය යුතුයි. 2012 වර්ෂයේ විශ්‍රාම වැටුප් වැඩි කිරීමේ සාධනීය ප්‍රවනතාවයක් තිබුනද 2006 සහ 2009 විශ්‍රාම වැටුප් වැඩි කිරීම ඉතාම අසාධාරණ බව හෙළි වනු ඇත.

**4**. ජීවන වියදමට සාපේක්ෂව මහ බැංකු සේවකයාට ඉහළ වැටුප් වැඩිවීමක් ලබාදීම සාධාරණය. නමුත් වැටුප් ද වැඩි විය යුතු අතර පවතින විෂමතා ඉවත් කර විශ්‍රාම වැටුප් ක්‍රමය සංශෝධනය විය යුතුව තිබුණි. (**වැටුප් විෂමතා ඉවත් කිරීම හා වැටුප් සංසෝධනය යනු දෙකක් මිස එකක් නොවන බව කල්පනාවට ගත යුතුය.**)

**02**. 1. 2006 වර්ෂයේ සිට වැටුප් සහ විශ්‍රාම වැටුප් වැඩිකිරීම සම්බන්ධයෙන් මහ බැංකුව අනුගමනය කළ ප්‍රතිපත්තිය නිසා එතෙක් පැවැති විශ්‍රාම වැටුප් විෂමතා උග්‍ර වෙමින් තිබේ. 2013.08.22 දින මහ බැංකුව විශ්‍රාමිකයන්ගේ සංගමය සමඟ පැවැති සාකච්ඡාවේ දී මහ බැංකු අධිපතිතුමා ගත් උදාහරණයම අපි ගෙන බලමු. 2006 වර්ෂයේදී නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ මූලික වැටුප 65.05%කින් වැඩි කර ඊට අමතරව රු. 30,000/- ක විශ්‍රාම වැටුප් සහිත දීමනාවක් ලබා දෙන විට විශ්‍රාමික නියෝජ්‍ය අධිපතිවරයෙකුට ලැබුණේ 12.5% ක් හෝ 5% ක් පමණි. මේ අනුව මහ බැංකුවේ ආරම්භක මූලික වැටුප හිමි නියෝජ්‍ය අධිපතිතුමා ඔහුගේ මූලික වැටුප 65.05% (රු. 41,900/-) වැඩිවීම සහ විශ්‍රාම වැටුප් සහිත දීමනාව වශයෙන් වැඩි වූ රු. 30,000/- ක මුදල සමඟ මාසික වැටුප් වැඩිවීම පමණක් රු. 71,900/- කි. 2006 වර්ෂයට පෙර විශ්‍රාම ගිය ඉහළම විශ්‍රාම වැටුප වැඩි වූයේ රු. 5700/- කින් පමණි. 2006 වර්ෂයේ දී මහ බැංකුවේ පහළම ශ්‍රේණියේ (සුළු සේවක 1) ආරම්භක මූලික වැටුප හිමි සුළු සේවකයාගේ වැටුප් වැඩිවීම 47.08% (රු.4500/-) සහ දීමනා වශයෙන් වැඩි වූ රු. 3000/- මුදල සමඟ මොහුගේ මාසික වැටුප් වැඩිවීම පමණක් රු. 7500/- කි. මහ බැංකුව විශ්‍රාමිකයා කෙරේ දක්වන ආකල්පය සහ මහ බැංකු සේවකයන්ට පොල් කටු හැන්දෙනුත්, විශ්‍රාමිකයාට කන් හැන්දෙනුත් බෙදීමේ න්‍යාය මෙමඟින් මොනවාට පැහැදිලි කර ඇත.

2009 වර්ෂයේ දී නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ මූලික වැටුප 39%කින් වැඩි කරන විට විශ්‍රාමික නියෝජ්‍ය අධිපතිවරයෙකුට ලැබුණේ විශ්‍රාම ගිය වර්ෂයට අනුව 15%ක් හෝ 5%කි. 2012 වර්ෂයේ දී නියෝජ්‍ය අධිපතිවරයෙකු මූලික වැටුප 43.04%කින් වැඩි කරන විට විශ්‍රාමික නියෝජ්‍ය අධිපතිවරයෙකුට විශ්‍රාම ගිය වර්ෂය අනුව ලැබුණේ 20%ක්, 15ක් හෝ 5%ක් පමණි. මෙම දත්තයන් සැලකිල්ලට ගත් කළ විශ්‍රාම වැටුප් විෂමතාවයන් (2006ට පෙර හා පසු විශ්‍රාම ගිය අය අතර) උග්‍රවන බව කිය යුතු නැත.

එවකට මහ බැංකු අධිපතිතුමා සඳහන් කළ මැත දී විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිතුමිය සහ මෙයට වර්ෂ 27කට පෙර විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිතුමා යන දෙදෙනා ම මහ බැංකුවේ එකම ශ්‍රේණියේ නිලධාරීන්ය. මෙම දෙදෙනාම මහ බැංකුව පමණක් නොව මුළු ආර්ථිකය ගොඩනැගීමට උර දී කටයුතු කළ බුද්ධිමතුන්ය. එම නිසා වර්තමානයේ විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිතුමියට සමානව ආත්ම ගෞරවයකින් යුතුව ජීවත් වීමේ අයිතිය අනෙක් විශ්‍රාමික අධිපතිතුමාට ද ඇත. එම අයිතියට කිසිවෙකුට අභියෝග කළ නොහැකිය.

| වර්ගය | ඒකක | 2006 ජනවාරි සාමාන්‍ය මිල රු. | 2012 ජනවාරි සාමාන්‍ය මිල රු. | වැඩිවීම සියයට ගණන |
|---|---|---|---|---|
| සහල් | | | | |
| සම්බා | කිලෝ 1 | 35.00 | 70.00 | 100% |
| නාඩු | කිලෝ 1 | 30.00 | 60.00 | 100% |
| අර්තාපල් (ලංකා) | කිලෝ 1 | 72.00 | 127.00 | 76.4% |
| වියළි මිරිස් | කිලෝ 1 | 130.00 | 210.00 | 61.5% |
| පොල් (මාළු) | ගෝනි 1 | 17.00 | 35.00 | 105.8% |
| කඩල | කිලෝ 1 | 102.00 | 191.00 | 87.2% |
| අලුත් මාළු | | | | |
| බලයා | කිලෝ 1 | 207.00 | 526.00 | 154.1% |
| සාලයා | කිලෝ 1 | 90.00 | 146.00 | 62.2% |
| එළවළු | | | | |
| බටර් බෝංචි | කිලෝ 1 | 85.00 | 173.00 | 103.5% |
| ගෝවා | කිලෝ 1 | 50.00 | 126.00 | 152% |
| කැරට් | කිලෝ 1 | 80.00 | 148.00 | 85% |
| බීට් රූට් | කිලෝ 1 | **73.00** | **150.00** | **105.4%** |

එම නිසා මහ බැංකුවේ යුතුකම සහ වගකීම වන්නේ මෑත දී විශ්‍රාම ගිය නියෝජ්‍ය අධිපතිතුමියට ද තව වර්ෂ 27 කින් මෙම විශ්‍රාමික නියෝජ්‍ය අධිපතිතුමාට සිදුව ඇති ඉරණමට මුහුණ දීමට සිදු වන තුරු බලා සිටීම නොව, එය වැළැක්වීමට වහාම පියවර ගැනීමයි.

2. අසමාන සේවාවන් දෙකක් සංසන්දනය කර නිගමනවලට එළඹීම සිද්ධාන්තයක් වශයෙන්ම වැරදිය. රාජ්‍ය සේවයෙහි සහ මහ බැංකු සේවයෙහි බඳවා ගැනීම් කාර්ය පිටිපාටිය, වැටුප් ක්‍රමය, උසස්වීම් ක්‍රමය ආදිය එකිනෙකට ඉදුරාම වෙනස්ය. එවැනි සේවාවන් දෙකක් සැසඳීම කිසිසේත්ම සාධාරණ නොවන නිසා මෙම සැසඳීමට දරණ උත්සාහය ප්‍රශ්නය මඟහැරීමට දරන උත්සාහයකි.

3. 2013.08.22 පැවැති සාකච්ඡාවේදී මහ බැංකුවේ විශ්‍රාම වැටුප් විෂමතාවන් ඇති බව අධිපතිතුමාම පිළිගෙන ඇත. විෂමතාවක් තිබේ නම් එය ඉවත් කළ යුතුය. විශ්‍රාම ගිය වර්ෂය පදනම් කර ගෙන විවිධ ප්‍රතිශතයන්ගෙන් විශ්‍රාම වැටුප් වැඩි කිරීමෙන් මෙම ප්‍රශ්නයට විසඳුම් සෙවිය නොහැක. එසේ ම රාජ්‍ය සේවක වැටුප් ක්‍රම සමඟ ගලපා ද උත්තරයක් සෙවිය නොහැක. එම නිසා විශ්‍රාම වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීම හැර වෙනත් විකල්පයක් නැත.

4. අප රට අනුගමනය කරන අර්ථ ක්‍රමයට අනුව භාණ්ඩ හා සේවා මිල වැඩි වීම අනිවාර්යයෙන්ම සිදු වේ. කෙටි කාලීනව යම් යම් ක්‍රියාමාර්ග ගත්ත ද භාණ්ඩ හා සේවා මිල අඩු කළ නොහැක. භාණ්ඩ හා සේවා වල මිල ඉතිහාසය කියාපාන කථාන්තරය එයයි. එම නිසා ජනතාවට අවම ජීවන මට්ටමවත් පවත්වා ගෙන යාම සඳහා ජීවන වියදමට සාපේක්ෂව ආදායම වැඩි කළ යුතුය. නමුත් මහ බැංකු විශ්‍රාමිකයාට 2005 න් පසු පැමිණියේ අභාග්‍ය සම්පන්න කළ දසාවකි.

2006 වර්ෂයේ සහ 2012 වර්ෂයේ මහ බැංකු විශ්‍රාම වැටුප් වැඩි කරන විට පැවති ජන ජීවිතයේ පැවැත්වීමට අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක් මිල ගණන් පහත පළ කරමු.

මූලය :- ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මෙසේ 2006 ජනවාරි සිට 2012 ජනවාරි වන විට සෑම භාණ්ඩයකම මිල වැඩි වී ඇත. මෙයට සාපේක්ෂව බැලූ විට ජීවන වියදම දෙගුණ වේ. ඊට සමාන්තරව විශ්‍රාම වැටුප් වැඩි විය යුතු ය. නමුත් මහ බැංකු විශ්‍රාමිකයාට 2012 දී විශ්‍රාම වැටුප ප්‍රමාණවත් ලෙස වැඩි වී නැත. 2006 ජනවාරි මස අප ලබා ගත් ඒකාබද්ධ විශ්‍රාම වැටුප (ආදායම) දෙගුණ විය යුතු වුවත් 50% කින් වත් වැඩි වී නැත. මෙයට ප්‍රධාන හේතුව ඉතා සුළු විශ්‍රාම වැටුප් වැඩි වීමක් ලැබීමයි.

4. සියලුම ගෙවීම් කළ පසු ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ ලාභය 2006 වර්ෂයේ රුපියල් මිලියන 27,851.6 වන අතර 2009 වර්ෂයේ රුපියල් මිලියන 33638.6ක් විය. 2012 වර්ෂයේ එය රු. මිලියන 66208.5 ක් විය. මෙමගින් ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක් 2006, 2009 සහ 2012 වර්ෂවල ලබා දීමට මහ බැංකුව ශක්තිමත් බවින් යුක්තව සිටි බව පෙනී යනු ඇත. මහ බැංකු පාලක පක්ෂය විශ්‍රාමිකයා කෙරේ දක්වන කුඩම්මාගේ සැලකිල්ල මෙමඟින් පිළිබිඹු වනු ඇත.

5. ආරම්භයේ සිට ම මහ බැංකුව ගොඩනැගීමට උරදුන් සහ ත්‍රස්තවාදි ප්‍රහාරයෙන් විනාශ වූ මහ බැංකුව යළි නඟාසිටුවීමට කැප වු සේවක, පිරිස අතුරින් අති බහුතරය ද විශ්‍රාමිකයෝ ය. ඔවුන්ගේ ලේ, කඳුළු, දහඩිය මතින් වර්තමාන මහ බැංකුව ගොඩනැගී ඇති බව සිහිපත් කරන්නෙමු. එබැවින් ඔවුන් රැකබලා ගැනීමේ පෝෂණය කිරීමේ යුතුකමක් සහ වගකීමක් නිතැතින්ම මහ බැංකුව සතුව පවතී. එබැවින් වැටුප් විශමතා ඉවත් කිරීමට අමතරව මහ බැංකු විශ්‍රාමිකයාට ආත්ම ගෞරවයක් ඇතුව ජීවත් වීමට ප්‍රමාණවත් විශ්‍රාම වැටුප් වැඩි වීමක්, 2015 වර්ෂයේ දීවත් ලැබෙනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි.





**සිරිසේන රත්නායක (3150)**
**0112 844178 / 071 3171706.**



# මහබැංකුව  හා භාණ්ඩාගාර බැඳුම්කරය ගැන වත්මන් අධිපතිතුමාගේ පැහැදිලි කිරීම.

**ආන්දෝලනයට තුඩු දී ඇති භාණ්ඩාගාර බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව**
**වත්මන් මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා**
**ස්වාධීන රූපවාහිනී සේවයේ මාධ්‍ය සාකච්ඡාවක දී**
**(2015 ජූනි 11 දින) කළ පැහැදිලි කිරීම විශ්‍රාමික මහ බැංකු සේවකයන් වන අපගේ**
**දැනගැනීම සඳහා කෙරෙන  සිංහල පරිවර්තනයයි.**

මාධ්‍යවේදියා: මහේන්ද්‍රන් මහත්මයා, ඔබ ඉතාමත් තීරණාත්මක වාතාවරණයකයි සිටින්නේ. මහ බැංකු අධිපති වශයෙන් ඔබට එරෙහිව විවේචන ගොඩක් තියෙනවා. මේ රටෙහි මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය ඔබගේ වගකීමයි. ඊට පෙර මම ඔබ ගැන දැනගන්න කැමතියි. ඔබගේ සම්පූර්ණ නම කියන්න.

අධිපතිතුමා : ලක්ෂ්මන් අර්ජුන මහේන්ද්‍රන්. මම උපන්නේ වසර 35 ක් විදේශ තානාපති සේවයේ යෙදුන පවුලක. මම ඔවුන් සමග විදේශ රටවල සංචාරය කළා. අවුරුදු 10 සිට මම අධ්‍යාපනය ලැබුවේ ශ්‍රී ලංකාවේ රාජකීය ප්‍රාථමික සහ රාජකීය විද්‍යාලයේ.

මාධ්‍යවේදියා: උසස් අධ්‍යාපනය

අධිපතිතුමා : ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානියේ මම උසස් පෙළ 1977 කරලා '78 දී එහෙ ගියා. මම එහෙ වසර 3 කින් උපාධිය ලබාගෙන, 1983 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවයට බැඳුණා.

මාධ්‍යවේදියා: ලංකාවේ විශ්ව විද්‍යාලයකට ඇතුළත් වීමට ඔබට අවකාශය ලැබුණේ නැද්ද?

අධිපතිතුමා : ලැබුණා. නමුත් ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයෙන් ශිෂ්‍යත්වයක් ලැබුණා. මම ඒ අවස්ථාව ගත්තා.

මාධ්‍යවේදියා: ඔක්ස්ෆර්ඩ් සිට ඔබ කොළඹට ආවා. ඔබගේ පළමු රැකියාව කුමක්ද?

අධිපතිතුමා : මුලින්ම මහවැලි අධිකාරියේ ආර්ථික විද්‍යාඥයෙක් ලෙස සේවය කළා අවුරුදු එකහමාරක් පමණ. නමුත් මගේ ප්‍රමුඛතාවය තිබුණේ ශ්‍රී ලංකා මහ බැංකුවයි. මට එහිදී අවස්ථාව සැලසුනා එවකට නියෝජ්‍ය මහ බැංකු අධිපති ආචාර්ය නෙවිල් කරුණාතිලක මහතා මුණගැසී..... ඔහුගේ උපදෙස් අනුව මාණ්ඩලික නිලධාරියෙක් වශයෙන් බැඳුණා.

මාධ්‍යවේදියා: සිංගප්පූරුවට යෑමට පෙර ඔබ ශ්‍රී ලංකාවේ කොපමණ කලක් සිටියාද?

අධිපතිතුමා : 2004 දක්වා සිටියා. දළ වශයෙන් වසර 40 ක් විතර

මාධ්‍යවේදියා: ඔබේ මිතුරන් හා පවුලේ ඥාතීන් බොහෝමයක් ශ්‍රී ලංකාවේ ඉන්නවා.

අධිපතිතුමා : තාම මගේ දෙමාපියෝ ශ්‍රී ලංකාවේ ඉන්නවා. තවත් ඥාතීන් කොළඹ, යාපනය සහ නුවර සිටිනවා. මම ශ්‍රී ලාංකිකයෙක්.

මාධ්‍යවේදියා: ඔබ මේ රටේ හැම තැනම ගිහින් තියෙනවාද?

අධිපතිතුමා : මම මහවැලි අධිකාරියේ වැඩ කරපු නිසා රටේ හැම අස්සක් මුල්ලක් නෑරම ගිහින් තියෙනවා. මහවැලි ව්‍යාපෘති ගණනාවක වැඩ කරපු නිසා මම රට ගැන හොඳට දන්නවා.

මාධ්‍යවේදියා: මට දැන් අහන්න පුළුවන් ඇයි ඔබ ශ්‍රී ලාංකිකයෙකු නොවෙයි කියලා සමහරු කියන්නේ? ඔබගේ දෙමාපියන් කවුද?

අධිපතිතුමා : මගේ පියා සී. මහේන්ද්‍රන් වසර 35 ක් විදේශ තානාපති සේවයේ යෙදුනා. මගේ තාත්තා වගේම අම්මත් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන්. ඔවුන් දෙදෙනාම මුළු ජීවිත කාලයම මේ රටට සේවය කරලා තියෙනවා. ඔවුන් විශ්‍රාම ගියත්, තවමත් විවිධ සමාජ සේවාවල යෙදෙනවා. මම  ශ්‍රී ලාංකිකයෙක්. සමහරු දෝෂාරෝපණය කරනවා මම විදේශිකයෙක් කියලා.

මාධ්‍යවේදියා: අපි ඊකට පස්සෙ එමු. ඔබ වසර 11 ක් මහ

බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයෙක් ලෙස සේවය කළා... ඒ වසර 11 දී ඔබ ශ්‍රී ලාංකිකයෙක්ද?

අධිපතිතුමා : ඔව්, ඒ වසර 11 තුළ දී මම ශ්‍රී ලාංකිකයෙක් විතරක් නෙමෙයි... මුදල් අමාත්‍යාංශයේ සේවයටත් මාව මුදා හැරියා පිස්කල් ප්‍රතිපත්ති අංශයේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන්. ඒ වගේම කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශයේ සේවය කළා. එවකට මහ බැංකු අධිපතිව සිටි ඒ. එස්. ජයවර්ධන මහතාගේ ආරාධනාවකින්.

මාධ්‍යවේදියා: රජයන් කීයක් යටතේ සේවය කළාද?

අධිපතිතුමා : මහ බැංකු සේවයට බැඳුන 1983 දී එක්සත් ජාතික පක්ෂ රජය. 1994 දී රජය මාරු වී අතිගරු චන්ද්‍රිකා කුමාරතුංග මැතිණිය ජනාධිපති වුණා. ඒ රජය යටතේත් කෙටි කාලයක් සේවය කළා. ඊට පස්සෙ මම පුද්ගලික අංශයට ගියා. මහ බැංකුවෙන් ඉවත් වුණා.

මාධ්‍යවේදියා: මහේන්ද්‍රන් මහත්මයා, ඔබට විරුද්ධව තියෙන එක දෝෂාරෝපණයක් තමයි ඔබ ශ්‍රී ලාංකිකයෙක් නොවන බව.. ඔබ සිංගප්පූරු පුරවැසියෙක් ඔබ ශ්‍රී ලංකාවට මෙතරම් ආදරේ කරන කෙනෙක් වෙලා ඇයි ශ්‍රී ලාංකික පුරවැසිභාවය අත්හැරියේ?

අධිපතිතුමා : 2001 දී මට BOI හි සේවය ආරාධනා ලැබී එහි වසර දෙකහමාරක් පමණ සේවය කළා. 2004 දී රජය මාරු වුණා. මම මගේ ඉල්ලා අස්වීම චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියට භාර දුන්නා. එය භාර ගත්තා. මම ශ්‍රී ලංකාවේ රැකියාවක් හෙව්වා. නමුත් ලැබුණේ නැහැ. UNP ආණ්ඩුවේ බලය නැති වුණා. මට BOI හි ඉහළ ප්‍රතිරූපයක් තිබුණ නිසා මාව ඒ පාක්ෂිකයෙක් හැටියටයි ගණන් ගත්තේ. මගේ සේවය අපක්ෂපාතීව කරන්න හැදුවත් මේ රටේ පුද්ගලික අංශය දේශපාලනික පසුබිමක් ඇති අයට රැකියා දීමට මැලිකමක් දක්වනවා. ටික කාලෙකට පස්සෙ මම හිතුවා සිංගප්පූරුවට යන්න. මට ඉක්මනින්ම සිංගප්පූරුවේ ව්‍යාපාර කරන ස්විස් බැංකුවක රැකියාව ලැබුණා. ඒ කාලේ වෙනකොට තිබුණ දේශපාලනික පසුබිම මත ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම එතරම් පහසු වුනේ නැහැ.... මොකද අපි වගේ පිරිසක් දේශපාලනික වෛරයට ඉලක්ක වෙලා හිටිය නිසා. නැසී ගිය ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා මා මැලේසියානු පුරවැසියෙක් කියලා කිව්වා. ඒක හැන්සාඩ් එකේ තියෙනවා. මම UNP එකට උදව් කරනවා, පිටරට ද්‍රවිඩ අන්තවාදීන් සමඟ සම්බන්ධතා පවත්වනවා කියලා පසු කාලෙක මගේ නම සඳහන් කරමින් ගරු ඩලස් අලහප්පෙරුම මහත්තයාත් ඒකම මාධ්‍යයට කිව්වා. ද්‍රවිඩ කොටින්ගේ අවශ්‍යතාවය මත විදේශීය බලවේග මෙරටට ගෙන ඒමේ කුමන්ත්‍රණයකට මා උදව් කරන බවකුත් ඔහු පැවසුවා. මේ ඔක්කොම මුසාවාදා.

මාධ්‍යවේදියා: මහේන්ද්‍රන් මහත්මයා, ඔබ UNP ක්‍රියාකාරකයෙක්ද? සාමාජිකයෙක්ද? නැතහොත් UNP රජය යටතේ වැඩ කරන වෘත්තිකයෙක්ද?

අධිපතිතුමා : මම UNP රජය යටතේ වැඩ කරපු වෘත්තිකයෙක්. මම කිසිම දේශපාලනික ක්‍රියාවක යෙදිලත් නැහැ. ඡන්දෙ ඉල්ලලත් නැහැ. මම UNP රජයට පක්ෂපාතී බව මට හංගන්න ඕනෙත් නැහැ.

මාධ්‍යවේදියා: රට අත් හැරලා ගිහින් සිංගප්පූරු වැසියෙක් වෙන්න ආසන්නතම හේතුව කුමක්ද?

අධිපතිතුමා : ලී ක්වාන් යූ යටතේ, විදේශ වෘත්තිකයන් තම රටට ගෙන්වා ගැනීමට ඔවුන් උනන්දු වෙනවා. ඔවුන් වැඩ කරන අතර පුරවැසිභාවයත් දෙනවා. ඒක ඔවුන්ගේ සාර්ථක වැඩසටහනක්. එමගින් අධ්‍යාපනය සහ වෘත්තීය සේවා මට්ටම් ඉහළ යනවා කියලා ඔවුන් හිතනවා. ඉස්සර ලංකාවෙන් ගිය වෛද්‍යවරු, නීතිඥයෝ ඒ සමාජය ගොඩනැගුවා. ඒ සම්ප්‍රදාය තාමත් එයාලා කරගෙන යනවා. විදේශිකයෝ ඇවිත් වැඩ කරන එකට එයාලා හරි විවෘතයි. 2004 මම ගිහින් වැඩ කරනකොට, රජය මට පුරවැසිභාවය පිරිනැමුවා. මට ශ්‍රී ලංකාවේ දේශපාලඥයින්ගෙන් චෝදනා එල්ල වුන නිසා, අපහසුතාවයට පත්වෙලා හිටපු මම ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත්තා. තව කාරණයක් තමයි මම ඒක ප්‍රතික්ෂේප කළා නම් මගේ රැකියාව අහිමි වෙන්නත් තිබුණා. මම එහෙ පුරවැසිභාවය ගත්තේ ඒ නිසයි.

මාධ්‍යවේදියා: ඉතින් ඔබ හිතුවා දේශපාලන වෛරය තියාගෙන කරදර වෙනවට වඩා තමන්ගේ පාඩුවේ හොඳ පුරවැසියෙක් වෙලා ඉන්න. ඒ වගේම ආසියාවේ සහ ලෝකය පුරාම ඔබ හොඳ මූල්‍ය කළමනාකරුවෙක් වශයෙන් හැඳින්වෙනවා. ඒ ගැන තහවුරු

කිරීමට ඔබට තියෙන සාක්ෂි මොනවාද?

**අධිපතිතුමා :** මම ලෝකයේ ලොකුම බැංකු එක්ක වැඩ කරලා තියෙනවා. ක්‍රෙඩිට් ස්විස්, HSBC මේවා විශාල ජාත්‍යන්තර බැංකු. මම ඒවායේ කළේ ඒ පාරිභෝගිකයන්ගේ මුදල්, විශ්‍රාම අරමුදල් සහ විවිධ ආයෝජන පරිපාලනය කරමින් ඒවා වර්ධනය කිරීමයි. මූලෝපාය විශේෂඥයෙක් වශයෙන් මගේ කාර්යභාරය ඒකයි. ඊට පස්සෙ මම ඩුබායි ජාතික බැංකුවේ වැඩ කළා. එහි ඩොලර් බිලියන 200 ක ආයෝජන මුදලක් පාලනය කළා. මගේ විශේෂත්වය තමයි ආයෝජන පරිපාලනයයි. ඒක පසුගිය වසර 30 දී මා ලබාගත්ත දැනුමක්...

**මාධ්‍යවේදියා :** ඒකට ආර්ථික විශේෂඥයෙක් වීම අවශ්‍යද?

**අධිපතිතුමා :** අනිවාර්යෙන්ම. මොකද ආර්ථික විද්‍යාඥයින්ට ලෝක වෙළෙඳපොළේ හැඩතල දැකීමේ හැකියාව තියෙනවා. විවිධ රජයන් දන්නවා ඔවුන්ගේ පිස්කල් ප්‍රතිපත්ති සහ මහ බැංකුවල මූල්‍ය ප්‍රතිපත්ති හසුරුවන හැටිත්, විනිමය අනුපාතයන් හසුරුවන හැටි ගැන මනා අවබෝධයක් තියෙනවා කියලා. මේ කාරණා සැලකිල්ලට ගෙන වත්කම් විභජනයක් කර පාරිභෝගිකයා දැනුවත් කරන්න ඕනෙ. ඊට පස්සෙ පාරිභෝගිකයා මේ කරුණු අවබෝධ කරගෙන ඔවුන්ගේ මුදල් ආයෝජනය පිණිස ලබා දෙනවා. මගේ ව්‍යාපාරය ඒකයි.

**මාධ්‍යවේදියා :** මහ බැංකුවේ අධිපති වෙන්න කලින් ඔබේ රැකියාව කුමක්ද?

**අධිපතිතුමා :** මම එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ විශාලතම බැංකුවේ ප්‍රධාන ආයෝජන නිළධාරියා ලෙස සේවය කළා. ඒක සාමාන්‍ය පාරිභෝගිකයන් පමණක් නෙමෙයි. රාජ්‍ය ආයතන සහ රජයන්වල පවා ආයෝජන මෙහෙයවනවා.

**මාධ්‍යවේදියා :** එවැනි සාර්ථක රැකියාවක් අතහැර මහ බැංකු අධිපති ධුරය බාර ගන්නේ ඇයි?

**අධිපතිතුමා :** ඉතාමත් සරලයි. වෙන රටක පුරවැසිභාවය ගත්තත් මම තාම හිතන්නේ මම ශ්‍රී ලාංකිකයෙක් කියලා. ඒ වගේම ඒක මගේ යුතුකමක් කියලා. ඔබගේ රටෙන් ඇරයුමක් ලැබුණාම ඔබ යා යුතුයි. මගේ පියා සිවිල් සේවකයෙක්. මගේ දෙමාපියන් රජයට සේවය කරලා තියෙනවා. ඉතින් අපට සම්ප්‍රදායක් තියෙනවා රජයට සේවය කරමින් රට ඉහළ තත්ත්වයකට ගේන්න. මම සලකන්නේ ඒක මගේ රාජකාරියක් කියලා.

**මාධ්‍යවේදියා :** අපි දන්න විදියට ආර්ථික විද්‍යාඥයින් ඉන්නෙ මහ බැංකුවේ. නමුත් දැන් දැන් ඔවුන්ව පිටරටින් කුලියට ගන්නා බව අහන්න ලැබෙනවා. ඉන් එක් ප්‍රධාන උපදේශකයෙකුට මසකට ඩොලර් 500,000 ක් ගෙවනවා. මොකද්ද මහ බැංකුව ඊළඟ මට්ටමට ගෙනයාමට හැකි ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයෝ නැති නිසා. මෙම තනතුර දැරීමට අවශ්‍ය අත්දැකීම්, සුදුසුකම් හා අවශ්‍ය නිරාවරණය ඔබ සතුයි කියලා හිතනවාද?

**අධිපතිතුමා :** මම හැමදේම දන්නවා කියලා කියන්නෙ නැහැ. නමුත් මටත් ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අයකු තරම්ම සෑහෙන අත්දැකීම් තියෙනවා. මහ බැංකුවට තියෙන්නේ මුදල් පරිපාලනය කිරීම, රජයට මූල්‍ය පහසුකම් ජනනය කර දීම සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීමයි. උද්ධමනය පාලනය කිරීමයි. ඒවා තමයි අපේ ප්‍රධාන අරමුණු. මම හිතනවා ඒකට මට අත්දැකීම් තියෙනවා කියලා. මම සෑහෙන වටිනාකමක් ඇති මුදල් ප්‍රමාණවාදී පාලනය කර තිබෙනවා. මම හිතනවා මට මේක සාර්ථකව කරන්න පුළුවන් කියලා.

**මාධ්‍යවේදියා :** දැන් අපි උණුසුම් මාතෘකාව වන ඔබට එරෙහිව නැගී ඇති චෝදනා ගැන කතා කරමු. ඔබ කණගාටු වෙන්නෙ නැද්ද මේ ධුරය භාරගැනීමෙන් ඔබ කේන්ද්‍රීය දේශපාලනයේ අතකොළුවක් වෙලා කියලා?

**අධිපතිතුමා :** කොහොමත්ම නැහැ. කාරණා දෙකක් කියන්න ඕනේ. මේ විවේචන බොහොමයක් ඇවිත් තියෙන්නේ දේශීය මාධ්‍යයේ එක්තරා කොටසකින් පමණයි. ජාත්‍යන්තර වාර්තාවල මේ කියනා අයථා ගණුදෙනුව පිළිබඳ සඳහනක් නැහැ. දෙවැනි කාරණාව, වෙනසක් ගෙන ඒමේ දී නිරන්තරයෙන්ම ඊට ප්‍රතිරෝධයක් ඇති වෙනවා. මම හිතන්නේ මේ තත්ත්වයට හේතුව වෙනසයි. අපිට ලොකු වෙනසක් කරන්න වුණා රජයේ බැදුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන්. එම වෙනස කිරීමේ දී දේශපාලඥයින් සහ ව්‍යාපාරිකයින්ට බලපෑමක් ඇති වුණා. මම හිතන්නේ ඔවුන් තමයි මේ විවේචනය පිටිපස්සේ සිටින්නේ.

**මාධ්‍යවේදියා:** 2010 සිට 2014 දක්වා භාණ්ඩාගාර බැදුම්කර නිකුත් කර තිබෙනවා. 2007 දී මහ බැංකුව ඩොලර් මිලියන 500 ක පමණ වාණිජ ණය ගැනීමටත් පටන් ගත්තා. ඒ කාලෙදි මහජනයා භාණ්ඩාගාරික බැදුම්කර ගැන අහලවත් තිබුණේ නැහැ. පසුව අපි දැනගත්තා මේ බැදුම්කර නිසි ක්‍රමවේදයන්ට පටහැනිව හෝ වෙන්දේසියකිනුත් තොරව නිතුත් කර ඇති බව. සමහරක් පුද්ගලික පාර්ශවවලට ඒවා මිලදී ගැනීමේ වැඩි හැකියාවක් තිබුණා. ඔබගේ ධූර කාලයේ දී මේ බැඳුම්කර ගැන අපි වඩාත් දැනුවත් වුණා. මේකට මොකද හේතුව? මොකක්ද මේ වෙනස? පසුගිය රජය කාලේ මහජනවා මේ ගැන දැනගෙන හිටියේම නැහැ.

**අධිපතිතුමා :** මට පේන විදියටපසුගිය රෙජිමය හැම දෙයක්ම පාලනය කරන්න හැදුවා. රාජ්‍ය අංශය ව්‍යාප්ත වුණා. බොහොමයක් ආයෝජන රජය මගින් කෙරුණා. විශේෂයෙන්ම යටිතල පහසුකම් ආදිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පුද්ගලික අංශයට පැවැත්මක් නැති වුණා. පාලනය කිරීමේ එක් කොටසක් වන්නේ පොලී අනුපාතය පාලනය කිරීම. ආර්ථික හැසිරවීමට වැදගත්ම සාධකයක් වන්නේ පොලී අනුපාතයයි. මෙම පොලී අනුපාතය පාලනය කිරීමේ එක් ක්‍රමයක් තමයි භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් වෙන්දේසි පාලනය කිරීම. ඒකට ප්‍රසිද්ධ වෙන්දේසි නොතබා, පොලී අනුපාතය රහසිගතව පෞද්ගලික ගණුදෙනු හරහා තමයි තීරණය කෙරුණෙ. ලෝකයේ කිසිම දියුණු රටක බහුතර බැඳුම්කර නිකුතු පෞද්ගලික ගණුදෙනු හරහා සිදු කරන්නේ නැහැ. කොහොත්ම නැහැ. අපේ මහ බැංකු අත් පොතේ විශේෂයෙන්ම සඳහන් කරලා තියෙනවා හැකිතාක් දුරට රජයේ බැඳුම්කර අලෙවිය සිදුකළ යුත්තේ ප්‍රසිද්ධ වෙන්දේසියෙන් බවට. මේක ලංකාව තුළ සිදුවුණේ නැහැ.

**මාධ්‍යවේදියා:** හරි.... රජයේ බැදුම්කර අලෙවියේ දී අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රමවේදය මොකක්ද?

**අධිපතිතුමා :** අත් පොතේ තියෙන නිවැරදි ක්‍රමය නම්, වෙන්දේසිය පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයක් කළ යුතුයි.

**මාධ්‍යවේදියා:** කොයි විදිහට ද?

**අධිපතිතුමා :** පුවත්පත් දැන්වීම් මගින්, මහ බැංකු වෙබ් අඩවියෙන් හෝ වෙනත් ඕනෑම මාධ්‍යය ක්‍රමවේදයකින් මහජනයා දැනුවත් කළ යුතුයි. දෙවනුව, වෙන්දේසි ක්‍රමාණුකූලව පැවැත්වීමෙන් ඒ සම්බන්ධව ක්‍රියාකරන මහජනයාට සහ විද්වතුන්ට ඊළඟ වෙන්දේසිය පිළිබඳව පූර්ව නිගමනයන්ට පැමිණීමට අවකාශය ලැබෙනවා. තුන්වෙනුව, එය සිදු කළ යුත්තේ මහජනයාට ලංසු මිල දැන ගත හැකි වන පරිදි විනිවිදභාවයකින් යුතුවයි. මේ කිසිවක් පසුගිය කාලයේ ශ්‍රී ලංකාවේ අනුගමනය කරලා නැහැ. වෙන්දේසි පවත්වා ඇත්තේ කඩින් කඩයි. 2014 දි අවසන් වෙන්සේදිය පවත්වා ඇත්තේ සැප්තැම්බර් මාසයේයි. හතරවෙනි කාර්තුවේ එකක්වත් නැහැ. මම හිතන්නේ මෙය විනිවිදභාවයට පටහැනි ක්‍රියාවලියක්. ඒ වගේම මූල්‍ය ප්‍රතිපත්ති සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි තත්ත්වයක්. මූල්‍ය ප්‍රතිපත්තිය කියන්නේ ආර්ථිකය හරහා මුදල් සංසරණය වන ක්‍රමයයි. වෙළෙඳපොළ ආශ්‍රිත නිසි පොළී අනුපාත නිර්ණය කරමින් නිසියාකාරව වෙන්දේසි නොපැවැත්වුව හොත් එය ආර්ථිකය හරහා ගමන් කරන මුදලට බලපෑම් ඇති කරනවා.

**මාධ්‍යවේදියා:** නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකල බව ඔබ පවසන්නේ. ඔබ ධූරය භාරගැනීමට පෙර අපි බැඳුම්කර නිකුතුව පිළිබඳ අසා තිබුණේ නැහැ. ඔබට එරෙහිව ඇති මතභේදය නම්, භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවයි. බැඳුම්කර නිකුත් කිරීමට අවශ්‍ය වුනු පසුබිම විස්තර කරන්න.

**අධිපතිතුමා :** විවිධ කාලසීමාවල් කල් පිරෙන බැදුම්කර තිබෙනවා. දීර්ඝතම එක වසර 30 යි. මම රාජකාරී භාරගැනීමෙන් පසු ජනවාරි මස මූල්‍ය මණ්ඩලයට වෙන්දේසි ආරම්භ කිරීමට මම යෝජනා කළ එහෙම යෝජනා කලේ වෙන්දේසියක් බොහෝ කලකින් පවත්වා නොතිබුණ නිසා. ඔවුන් එකඟ වුණා.

**මාධ්‍යවේදියා:** අවසන් වරට වෙන්දේසියක් තිබුණේ කවදාද?

**අධිපතිතුමා :** 2014 දෙසැම්බරයේ පොඩි එකක් තිබුණා. නමුත් අවසාන එක 2014 සැප්තැම්බර් තිබුණේ. ඒවා ක්‍රමවත්ව නොපැවැත්වූ නිසා මම කිව්වා නිසි ආකාරයට වෙන්දේසි පැවැත්විය යුතු බව. මීට පෙර සියයට 90 ක්ම වෙන්දේසි පැවැත්වුනේ පෞද්ගලිකවයි. සියයට 10 කට අඩු ප්‍රමාණයක් තමයි වෙන්දේසි කළේ. මම

කිව්වා මේ ඔක්කොම වැරදියි කියලා.

**මාධ්‍යවේදියා:** එහෙම කරන්න ක්‍රමවේදයේ අවසරය තියෙනවාද?

**අධිපතිතුමා :** නැහැ. අත්පොත කියනවා හැකි තරම් වෙන්දේසි හරහා තියන්න කියලා.

**මාධ්‍යවේදියා:** එහෙනම් කොහොමද එහෙම වුනේ?

**අධිපතිතුමා :** පසුගිය කළමනාකාරීත්වය හිතන්න එහෙම කළේ අනුපාතය පාලනය කිරීමෙන්. පොලී අනුපාතයේ කෘත්‍රිම තත්ත්වයක් ඇති කිරීමෙන්ම. එමගින් ආර්ථිකය පාලනය කරන්න බලාපොරොත්තු වෙන්න ඇති.

**මාධ්‍යවේදියා:** ඒකද එකම හේතුව? නැත්නම් හෙංචයියලාට වාසි වෙන්නද?

**අධිපතිතුමා :** ඒක අපි පරීක්ෂා කළ යුතුයි රහසිගත ක්‍රම තියෙද්දි එවැනි දේවල්වලට ඉඩ තියෙනවා. ඒක අපි දැඩි ලෙස පරීක්ෂා කළ යුතුයි. නාලිකාවකින් මට තවත් පාර්ශවයකට දෝෂාරෝපණය කරන්න බැහැ.

**මාධ්‍යවේදියා:** මෑතදී නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා හේතු අපිට කියන්න.

**අධිපතිතුමා :** ඒ ගැන තීරණය කළේ පෙබරවාරි 23 වෙනිදා. අපේ වෙබ් අඩවියේ දැන්වීම් පළ කලේ 25 වෙනිදා. එහි සඳහන් වුනා වසර 30 බැඳුම්කර නිකුත් කරන බවත්, පොලී අනුපාතය සියයට 12.5 වන බවත්. එය 26 වෙනිදා පුවත්පත් වලත් පළ වුණා.

**මාධ්‍යවේදියා:** 12.5 යි කියලා තිබුණද?

**අධිපතිතුමා :** ඔව් පැහැදිලිවම.

**මාධ්‍යවේදියා:** එතකොට පළ කර නොතිබුණා කියන කට කතාව ඇත්තද?

**අධිපතිතුමා :** සම්පූර්ණ බොරුවක්. මට අවශ්‍ය නම් පෙන්නන්න පුළුවන්.

**මාධ්‍යවේදියා:** නැවත වෙන්දේසිය පටන් ගන්න තිබුණ අවශ්‍යතාවය මොකද්ද? අපිට අහන්න ලැබුණා අධිවේගී මාර්ග සහ වෙනත් දේවල්වලට මුදල් අවශ්‍ය බව.

**අධිපතිතුමා :** ඒක ඇත්ත. ඔබ දන්නා පරිදි ගරු මුදල් ඇමතිතුමා ජනවාරි 29 වෙනිදා අයවැයක් ඉදිරිපත් කළා. එහිදී රාජ්‍ය අංශයේ පඩි සියයට 40 කින් පමණ වැඩි කළා. ඒකෙන්ම මුදල් අමාත්‍යාංශයට අවශ්‍ය මුදල් ප්‍රමාණය වැඩි වුණා. අපේ එක කාර්යභාරයක් වන්නේ රජය වෙනුවෙන් ණය ලබා ගැනීමයි. මේක ශ්‍රී ලංකා මහ බැංකුවට පමණක් සීමා වුන කාරණයක්. ඒක මහ බැංකුවට ප්‍රශ්ණ කරන්න බැහැ. භාණ්ඩාගාරය හෝ මුදල් අමාත්‍යාංශය මුදල් අවශ්‍ය බවට නියෝග කළ පසු එය ලබාදීම අපේ රාජකාරියයි. මාර්තු 02 වෙනිදා රුපියල් බිලියන 13.5 ක් ලබාදිය යුතුමයි. ඒකයි තත්ත්වය. මාර්තු 02 වෙනිදාට පෙර වැඩ කරන අවසාන දිනය පෙබරවාරි 27 යි. එදාට අපි රුපියල් බිලියන 13.5 ක් දිය යුතුයි. මම 27 වෙනි දින රාජ්‍ය ණය අංශයට කතා කළ විට එහි නිළධාරීන් මට පැවසුවේ අපි ජනනය කර ඇත්තේ රුපියල් බිලියන 3.5 ක් පමණක් බවයි. ඉල්ලුම් කරලා තියෙන්නේ බිලියන 13.5 ක්. එතන බිලියන 10 ක පරතරයක් තියෙනවා. මම නිලධාරීන් සමග කතා කළා එක් වැඩකරන දිනකදි රුපියල් බිලියන 10 ක් සොයන්නේ කොහොමද කියලා. ඔවුන් කිව්වා, වෙන්දේසියක් පැවැත්වෙනවා බලමු ඒකෙන් මුදල් ජනනය වෙයිද කියලා. ඔවුන් බලාපොරොත්තු වූ පුද්ගලික ස්ථාපනය ක්‍රියාත්මක වුනේ නැහැ.

**මාධ්‍යවේදියා:** ඒ කියන්නේ ඔබ තනි තීරණයක් ගත්තේ නැහැ?

**අධිපතිතුමා :** ඒක සාමූහික තීරණයක්, මහ බැංකුවේ සියලුම ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ.

**මාධ්‍යවේදියා:** ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ද? මූල්‍ය මණ්ඩලයද?

**අධිපතිතුමා :** මූල්‍ය මණ්ඩලය අපට වෙන්දේසිය පැවැත්වීමට අවසර දුන්නා. මූල්‍ය මණ්ඩලය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වෙන්නේ නැහැ. ඒක කරන්නේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය. මම, නියෝජ්‍ය අධිපතිවරුන්, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අදාල නිළධාරීන්ගෙන්. ඒක සිද්ද වෙන්නේ ටෙන්ඩර් කමිටු ක්‍රමය හරහායි.

**මාධ්‍යවේදියා:** වෙන්දේසියක් ක්‍රියාත්මක කළායින් පසු, කළ යුතු වෙනත් දේ මොනවාද?

**අධිපතිතුමා :** නිවේදනයක් මගින් වෙන්දේසියේ කොන්දේසි ඉදිරිපත් කළ යුතුයි. අපි රුපියල් බිලියනයක මුදලක් සියයට 12.5 ක පොලියට බලාපොරොත්තු වෙනවා. එම මුදල් භාරදිය යුතු දිනය වන්නේ මාර්තු දෙවනදායි. මීට ලංසු තැබිය හැක්කේ මූලික සමාගම් කණ්ඩායමකට පමණයි.

EPF සහ NSB එයාලත් විශාල මුදල් ප්‍රමාණයක් පරිපාලනය කරනවා. ඒ අයට පමණයි වෙන්දේසියේ ලංසු තබන්න පුළුවන්. ඉන් පසු අපි ලංසු තියන්න කියලා කියනවා. 11 ට ලංසු තැබීම ඉවරයි. ඊට පස්සේ පොලී අනුපාතය අනුව ලැයිස්තුව සකස් කරනවා. ඔබ 12.5 ට ඉල්ලන අතර, කෙනෙක් 11.5 ට හෝ 8 ට හෝ 9 ට ලංසු තියන්න පුළුවන්. රජය පිළිගනී යැයි ඔවුන් සිතන ඕනෑම ලංසුවක් ඔවුනට තැබිය හැකියි. ටෙන්ඩර් කමිටුවේ ඇගයීමෙන් පසුව සුදුසු අයට එය පිරිනමනවා ඇත. ඒ විදිහටයි මේ ක්‍රියාවලිය සිදුවන්නේ.

මාධ්‍යවේදියා : කෙටි කාලීන නොවී ඇයි වසර 30?

අධිපතිතුමා : මීට පෙරත් අපි 30 වසරකට නිකුත් කරලා තියෙනවා. ''ප්‍රතිලාභ වක්‍රය'' කියා යමක් තියෙනවා. විවිධ කාලවලදී කල් පිරෙන බිල්පත් මහජනයාට නිකුත් කරනවා. මහජනයාටත් එවැනි බිල්පත් අවශ්‍යයි. රක්ෂණ හෝ විශ්‍රාම සමාගමක පාරිභෝගිකයන් වසර 20 කින් හෝ 30 කින් පමණ විශ්‍රාම යනවිට ඔවුන්ගේ මුදල් නැවත ගෙවීමට යම් කිසි ක්‍රමයක් සහ අවස්ථාවක් තිබිය යුතුයි. ඒ නිසයි අපි වසර 30 කට බිල්පත් නිකුත් කරන්නේ සමහර රටවල ඒක වසර 50 ක් හෝ වසර 99 ක් දක්වා නිකුත් කරනවා. ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ පරිණාමය වෙමින් දැන් වසර 30 දක්වා වර්ධනය වෙලා තියෙනවා.

මාධ්‍යවේදියා : වසර 50 හෝ 99 දක්වා දීර්ඝ කළ රටවල් කීපයක් තියෙන්න පුළුවන්ද?

අධිපතිතුමා : එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, යුරෝපයේ.. ඉතාලිය, ජර්මනිය, ප්‍රංශය, ජපානය වැනි රටවලට සංකීර්ණ බැඳුම්කර වෙළෙඳපොළක් තියෙනවා. චීනයේ, වසර 50 ක සහ සිංගප්පූරුවේ වසර 99 ක බැඳුම්කර තියෙනවා. ඔවුන් ඒවා සුපිරි නිවාස සංකීර්ණ සඳහා ආයෝජනය කරනවා. මැලේසියාවෙත් වසර 99 දක්වා විවිධ බැඳුම්කර තියෙනවා. ඒවා යොදවන්නේත් දීර්ඝ කාලීන ව්‍යාපෘති සඳහායි. ඔබට දීර්ඝ කාලීන ආයෝජනයකට කෙටි කාලීන බැඳුම්කරයක් යොදවන්න බැහැ. ඒක වැරදි මූල්‍ය ක්‍රමයක්. ඒ හින්දා තමයි ශ්‍රී ලංකාව දීර්ඝ කාලීන ව්‍යාපෘති සඳහා දීර්ඝ කාලීන බැඳුම්කර නිකුත් කළ යුත්තේ.

මාධ්‍යවේදියා : ඔබ යම්කිසි නව්‍යතාවයක් හා විවිධත්වයක් ගෙනෙන්නට උත්සාහ කළා. දැන් ඒක ආපසු ඔබටම කැරකිලා ඇවිත් නේද?

අධිපතිතුමා : මම කිව්වා වගේ ''වෙනසකට'' සමහර අය කැමති නැහැ. මොකද සමහරු ලාභ ලබන විදිහ එමගින් වෙනස් වෙනවා.

මාධ්‍යවේදියා : ඒ කියන්නේ ආපසු කැරකීමක්ද?

අධිපතිතුමා : ඊට ලැබුණ අති විශාල ප්‍රතික්‍රියාව සලකා බැලීමේ දී, මම හිතන්නේ ඒක ආපසු කැරකැවීමක් තමයි. දේශපාලනික සහ ව්‍යාපාරික ක්ෂේත්‍රවල වත්කම් සතු අය අප ගෙනා මේ වෙනසට ප්‍රතික්‍රියා කෙරුවා. මේක මීට ඉස්සරත් වෙලා තියෙනවා. මං උදාහරණයක් දෙන්නම්, 1993 දී පමණ මම ජේ. එස්. ජයවර්ධන මහතා සහ රනිල් වික්‍රමසිංහ මහතාගේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සේවය කළ කාලේදී අපි කොටස් වෙළෙඳපොළක් විවෘත කිරීම සම්බන්ධයෙන් යෝජනා ගෙනාවා. එම කාලේ දී ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළ ශ්‍රී ලාංකිකයන්ට පමණක් සීමා වුණා. 1993 දී අපි යෝජනා කළ කොටස් වෙළෙඳපොළ විදේශික ආයෝජකයින්ටත් විවෘත කරන්න කියලා. මීට සමානවම විශාල ආන්දෝලනයක් එවරත් ඇති වුණා. වෙළෙඳපොළේ හිමිකම් තිබූ අය, ඒක ඔවුන්ට තර්ජනයක් කියලා බය වුණා. විදේශිකයන් ඔවුන්ගේ කොටස් මිලදී ගෙන ඔවුන්ගේ ජීවිත අපහසුතාවයට පත්කරයි කියලා හිතුවා. මේක සමාන අවස්ථාවක්. මම ඒකට කලින් මුහුණදීලා තියෙනවා. මේ පාරත් අපි ඒ වෙනස භාරගත්තා. මම ගරු අගමැතිතුමාව සහ සියලුම කැබිනට් ඇමතිවරුන් දැනුවත් කළා. මම කිව්වා මේක හොඳයි, මේක කළ යුතුයි මොකද එයින් ආර්ථිකයට හොඳක් වෙනවා කියලා. ශ්‍රී ලංකාව සංවර්ධනයට සූදානම් නම් අපට නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වන වෙළෙඳ ආර්ථිකයක් තිබිය යුතුයි කියලා.

මාධ්‍යවේදියා : රජයේ නිලධාරීන් මාසිකව ඔවුන්ගේ වේතනය ලබා ගන්නවා සහ මාර්ග සංවර්ධනය කෙරීගෙන යනවා. යහපාලනය යටතේ නාස්තිය හා දූෂණයෙන් තොරව යටිතල පහසුකම් වැඩ සටහන් කෙරීගෙන යනවා. ආර්ථික විනිවිදභාවයෙන්, නිසි ආකාරයෙන් හා වගකීමෙන් යුතුව සිදුවෙන තාක් කල් මහජනයා භාණ්ඩාගාර බිල්පත් හා පොලී අනුපාතයන් පිළිබඳ තැකීමක් කරන්නේ නැහැ. කේන්ද්‍රීය දේශපාලනික වාතාවරණය විවිධ දෝෂාරෝපණ ඉදිරිපත් කරනවා. ඒවා ඇත්තද, නැත්තද

කියලා අපි දන්නේ නැහැ. ඉන් එක දෝෂාරෝපණයක් තමයි මේ ගණුදෙනුව තුළින් රජයට රුපියල් බිලියන 40 ක පමණ පාඩුවක් සිදු වූ බව. ඒක ඇත්තද? මහජනයාට මේක තේරෙන්නේ නැහැ. නමුත් දේශපාලනඥයෝ පාර්ලිමේන්තුවේ මෙ ගැන නොයෙකුත් ප්‍රකාශ කරනවා. විශාල පාඩුවක් සිදුවුණා කියනවා. ඒක වෙන්නේ කොහොමද?

අධිපතිතුමා : ඒක සම්පූර්ණ මුසාවක්.

මාධ්‍යවේදියා: ඒත් දේශපාලනඥයෝ ඒ වගේ මුසාවන් කියන එකක් නැහැ.

අධිපතිතුමා : එයාලා ඉතාම සරළ කතාවක් කියනවා. නමුත් ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. මට තේරෙන විදිහට දෝෂාරෝපණය මම බිලියන 1 සිට බිලියන 10 දක්වා වැඩි කිරීමයි. මම ඒකට උත්තර දෙන්නම්. දෙවනුව සියයට නමය හමාරක පොලියෙන් මුදල් ඉපයීමට තිබුණත් මම එය කෘතීමව සියයට දොළහා හමාර දක්වා ඉහළ දැමූ බවත්. ඒක මගේ පුද්ගලික තීරණයක් නෙවෙයි. ටෙන්ඩර් මණ්ඩලය මගින් ඒකාබද්ධව ගත්ත තීරණයක්. එම මණ්ඩලයේ මම හිටියෙත් නැහැ. ඒක මහ බැංකුවේ ඉහළ කළමනාකාරීත්වය මගින් සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ගත් තීරණයක්. ටෙන්ඩර් මණ්ඩලය නිදහස්ව ක්‍රියා කරලා තියෙනවා. ඒකයි පළවෙනි කාරණය. දෙවනුව මෙම තීරණය ගත්තේ මුදල් අමාත්‍යාංශය විසින්. මහ බැංකුවට මාර්තු 02 දින වන විට රුපියල් බිලියන 13න හමාරක් සපයන ලෙස නියෝග කිරීම නිසයි පෙබරවාරි 27 වන දින වන විට අප සතුව රුපියල් බිලියන 10ක් පමණක්වත් තිබුණේ නැහැ. ඒක වුනේ සිකුරාදා. මුදල් දීමට තිබුණේ සඳුදා. ඉතින් අපට තිබුණ එකම මාර්ගය මේ වෙන්දේසිය පැවැත්වීම පමණයි. මුදල් සෙවීමට හේතුව ඒකයි.

මාධ්‍යවේදියා: රුපියල් බිලියන 10 ක හදිසි අවශ්‍යතාවක් ඇති බව හඳුනා ගත්තේ කවදාද?

අධිපතිතුමා : ඒ අවශ්‍යතාවය මහ බැංකුවට දැන්වූයේ මාසයකට පෙරයි. පෙබරවාරි මුල මුදල් අමාත්‍යාංශය මෙපමණ මුදල් මාර්තු මුදල් සංසරණය සඳහා අවශ්‍ය බව ලිඛිතව දැනුම් දුන්නා. මෙම රුපියල් බිලියන 13.5, 2015 මාර්තු 02 දිනට අවශ්‍ය බව විශේෂයෙන්ම සඳහන් කර තිබුණා. ඒ මුදල අපි දිය යුතුයි. මහ බැංකුව සහ අපේ කණ්ඩායම, බලාපොරොත්තු තියාගෙන හිටියේ පැරණි ක්‍රමය මතයි. පැරණි ක්‍රමය වන පුද්ගලික ස්ථාපන මතයි. බිලියන 13.5 පුද්ගලික ස්ථාපනය හරහා සොයා ගැනීමටයි. පෙබරවාරි 27 වන දින වන විට එමගින් සොයාගත හැකි වූයේ මිලියන 3.5 ක් පමණයි. අපිට සොයා ගැනීමට තව බිලියන 10 ක අඩුවක් තිබුණා. ඉතින් තිබුන එකම විකල්පය මේ හරහා යෑමයි.

මාධ්‍යවේදියා: ප්‍රධාන දෝෂාරෝපණය මූලිකව බිලියන 1 ක් සඳහන් කර පසුව එය බිලියන 10 දක්වා වැඩි කිරීමයි. ඔබ එය වැඩිවීම නොකළා නම් ඉන් ඇතිවන ප්‍රතිඵලය කුමක්ද?

අධිපතිතුමා : ප්‍රතිඵලය වෙන්නේ ඊලඟ සතියේ මුදල් අමාත්‍යාංශයට අවශ්‍ය මුදල නොලැබී යාමයි. කුඩා තේ සහ රබර් වතු හිමියන්ගේ සහනාධාර, මාර්ග සහ අධිවේගී මාර්ග තැනීමට අවශ්‍ය ගෙවීම්වලට මුදල් නැතිව යෑමයි. මේ සියලුම ගෙවීම් ක්ෂණිකව නතර වෙනවා. දැනටමත් රජය අවශ්‍ය මුදල් ලබා නොදෙන බවට ගොඩනැගිලි කර්මාන්තය පැමිණිලි කරනවා. මේ නිසා තත්ත්වය තවත් බරපතල විය හැකිව තිබුණා. සමහර ව්‍යාපෘති අවලංගු වීමට ද ඉඩ තිබුණා. ඒකෙන් රටේ ආර්ථිකයට බලපෑම් ඇති කරන්න පුළුවන්.

මාධ්‍යවේදියා: ඒ කියන්නේ ජනවාරි 8 න් පසු නව රජය පිහිටුවීමෙන් පසු රජයේ භාණ්ඩාගාරය හිස් කියලද?

අධිපතිතුමා : ඔව්. භාණ්ඩාගාරය හිස්. මම එක් අවස්ථාවක් කියන්නම්, වසර 5 කට පෙර නිකුත් කළ ජනවාරි මාසයේ ආපසු ගෙවීමට නියමිත ඩොලර් බිලියන 500 ක බැඳුම්කරයක් තිබුණා. ජනවාරි 9 හෝ ඊට ආසන්න දිනයක දී මහ බැංකු අධිපති ඉල්ලා අස්වෙනවා මේ බැඳුම්කරය නැවත ගෙවීමට අවශ්‍ය මුදල් සෙවීම සඳහා කිසිම සැළසුමක් යොදවන්නේ නැතිව. අපගේ සංචිතයේ මුදල් යොදවා ඒ මුදල ගෙවීමට සිදු වූ අතර එමගින් අපගේ විදේශ විනිමයේ අඩුවකුත් ඇති වුණා. ඒකෙන්ම පේනවා මේ ජනවාරියේ නව රජය බලයට පත්වන විට කිසි සූදානමක් නොතිබුණ බව.

මාධ්‍යවේදියා: මේ මාස 3 ඇතුළත දෝෂාරෝපණ, පැමිණිලි සහ විවේචන මැද ඒ හා සම්බන්ධව සෘජුව හෝ වක්‍රව ඔබගේ

සම්බන්ධතාවය තිබුණු බව ඔබ ප්‍රතික්ෂේප කරනවා. ඒත් මහජනයා වශයෙන් අපි හිතනවා මහ බැංකු අධිපති වන ඔබ සියලුම වගකීම් දරනවා කියලා. මෙහි සම්බන්ධතාවය ඇති බව ඔබ තරයේ ප්‍රතික්ෂේප කරන එක අපි කොහොමද විශ්වාස කරන්නේ?

අධිපතිතුමා : තීරණ ගැනීමට සම්බන්ධ නැතැයි කියලා මම කිව්වේ නැහැ. ඒක මහ බැංකු ඉහළ කළමනාකාරිත්වයේ ඒකාබද්ධ තීරණයක්. මම කිව්වේ ප්‍රාථමික ගැණුම්කරුවන්ට, EPF සහ ETF ආදීන්ට බැඳුම්කර වෙන් කිරීමේ දී සහ විකිණීමේ දී මම කිසියම් පාර්ශවයකට පක්ෂග්‍රාහි නොවූ බවයි. ඒ කොටසට මම සම්බන්ධ නැහැ. මම කමිටුවේ අනික් සාමාජිකයින් සමග මුදල් ජනනය කිරීම සම්බන්ධව එකඟ වෙන්න ඇති. ඒ ලංසු වෙන් කිරීම අනුමත කරන ලද විද්‍යාත්මක හා තාක්ෂණික ක්‍රමවේදයන් මතයි. ටෙන්ඩර් කමිටුව ඒ වැඩේ නිසියාකාරව කළා. ඔවුන්ගේ නිර්දේශයට මමත් එකඟ වුණා.

මාධ්‍යවේදියා: අවසන් තීරණය ගන්නේ ටෙන්ටර් කමිටුවද, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවද?

අධිපතිතුමා : ටෙන්ඩර් කමිටුව.

මාධ්‍යවේදියා: ඔවුන්ද වෙන් කිරීම කරන්නේ.

අධිපතිතුමා : ඔව්.....

මාධ්‍යවේදියා: ඔබගේ පුතා සම්බන්ධ සමාගමක් මේ ගණුදෙනුවෙන් ලාභ ලැබූ බවට පැවසෙනවා.

අධිපතිතුමා : ඒක එහෙමයි. එම වෙන්දේසියෙන් සියයට 50 ක් එක්තරා සමාගමකට ගියා. ඒ කමිටුව ප්‍රකාශ කර හිටියා එක්තරා සමාගමක් බැංකුවක් හරහා අසාමාන්‍ය ලංසු තැබීමක් කරනවා කියලා. මේ වන විට ඒ ගණුදෙනුව ''කෝප්'' හරහා පරීක්ෂණයට භාජනය වෙමින් පවතිනවා. නමුත් ටෙන්ඩර් කමිටුව ඔවුන්ගේ රාජකාරිය නිසා ලෙස කර තිබෙනවා. ඔවුන්ගේ කාර්ය වන්නේ රජයට අවශ්‍ය මුදල් අවම මිලකට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ලබා ගැනීමයි. ඒ කියන්නේ උද්ධමනය වැඩි නොවන ආකාරයට සහ අනවශ්‍ය ලෙස මුදල් ජනනය නොකරන ලෙස සියලුම කාර්යයන් ටෙන්ඩර් කමිටුව සිදුකර තියෙනවා. බැඳුම්කරය පිරිනැමූ දින වන විට එම සමාගම බැඳුම්කර විශාල ප්‍රමාණයක් ලබාගත් බව අප දැන සිටියේ නැහැ. පසුව තමයි බැංකුව සහ මේ සමාගම අතර අසාමාන්‍ය ගණුදෙනුවක් සිදුවී ඇති බවට චෝදනා ඉදිරිපත් වූයේ. ඒ ගැන දැන් පරීක්ෂා කරනවා.

මාධ්‍යවේදියා: මේ ගණුදෙනුව සිදුවන විට ඔබේ බෑණා එම සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙක්ව සිටියද?

අධිපතිතුමා : නැහැ. මම මහ බැංකු අධිපති වූ දින ඔහු ඒ සමාගමෙන් ඉල්ලා අස්වුණා.

මාධ්‍යවේදියා: අපට ආරංචියි ඔබ රාජකාරී භාර ගැනීමට මාසයක් පමණ ගතවුණා කියලා. මොකද ඔබගේ බෑණා සමාගමෙන් ඉල්ලා අස්වීමට තිබුණ නිසා.

අධිපතිතුමා : නැහැ. ඔහු වහාම ඉල්ලා අස්වුණා. ඒ එක්කම මහ බැංකුවේ ණය දෙපාර්තමේන්තුවට ඒ පිළිබඳ දැනුම් දීමකුත් කළා. ඒ දැනුම් දීමෙන් ඔහු සමාගම සමග කිසිම සම්බන්ධතාවයක් නැති බව තහවුරු කරලා තියෙනවා.

මාධ්‍යවේදියා: ඇයි ඔබ බෑණාට ඉල්ලා අස්වෙන්න කිව්වේ?

අධිපතිතුමා : මම කිව්වේ නැහැ. එයා ස්වේච්ඡාවෙන් ඒක කළා. මෙතන මත ගැටුමකට ඉඩකඩ තිබුණා. මොකද මගේ සුපරීක්ෂණය යටතේ පවතින සමාගමක ඔහු සේවය කරනවා සේම මගේ සුපරීක්ෂණය යටතේ තියෙන බැංකුවක සේවය කිරීම මත ගැටුමකට හේතුවන නිසා. එතකොට මම බලාපොරොත්තු වෙනවා ඔහු ඉල්ලා අස්වෙයි කියලා. ඊට අමතරව, මගේ ඥාතියෙකුගේ සම්බන්ධයක් ඇති කිසිම සමාගමක් සම්බන්ධ තීරණයක් සිදුවුවහොත් මූල්‍ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ට තීරණය ගැනීමට අවස්ථාව දී මම ඉන් ඉවත් වෙනවා. ඒක සාමාන්‍ය පරිපාලන ක්‍රමය. මම එම ක්‍රමවේදය අනුගමනය කර තිබෙනවා.



**සංස්කරණය :**
**අමරපාල කරසිංහ ආරච්චි**

# 'අනේ මෙහෙම තණ්හාවක්'

**දී**නක් එක්තරා තරුණයෙක් තවත් පිරිසක් සමග අප නිවසට පැමිණ තමා වකුගඩු රෝගියෙකු බැව් පවසා, තම හැඳුනුම්පතද, ශල්‍ය වෛද්‍යාදී ආරෝග්‍යශාලා වියදම් වාර්තාවක්ද පෙන්වීය. ඒ අනුව ශල්‍ය හා වෙනත් වියදම් සඳහා රුපියල් අට ලක්ෂයක් පමණ වැය වේයැ'යි එහි සඳහන්ව තිබිණ. ඔහු තමනට මෙම වියදම් කොහෙත්ම දැරිය නොහැකි බැවින් ආධාරයක් කරන මෙන් අයැද සිටි අතර, ආධාර කරුවන් විසින් සී.ආර්. පොතක සටහන් තබා තිබෙනු දක්නට ලැබිණ. ඔවුන්ගේ නම් ගම් සහ ලිපිනයන් හැර එහි සටහන්ව තිබූ වැකි කිහිපයක් පමණක් මෙසේය.

1. උදේනි දියණියගේ ශිෂ්‍යත්ව සාමාර්ථ පතා රු. 500.00
2. චින්තක පුතාගේ කොරය සුවපත් වේවා'යි සෙත්පතා රු. 500.00
3. විදේශගතව සිටින දියණියට නිදුක් නිරෝගී සුවපතා රු. 250.00
4. මියගිය දෙමාපියන්ට පිං පිණිස රු. 500.00
5. සගමොක් සුවය පතා රු. 250.00

යනාදී වශයෙන් එහි වැකි සියල්ලක්ම පාහේ මෙබඳු විය. සමස්තයක් වශයෙන් ගත් කල ඒවා ඔවුන්ගේ සිත්තුළ කැකෑරී පැවති සිතුම් පැතුම් ය'යි සැළකිය හැකිය. කුමකින් හෝ ඒවා ඉටුකර ගැනීම ඔවුන්ගේ පරමාර්ථය බැව් පෙනේ. හිඟන්නෙකුට සතයක් දී හෝ ඔවුන් බලන්නේ ඒවා ඉටුවේද යන්නය. මෙසේ එකිනෙකාගේ දුක් කම් කටොලු හා විවිධ ප්‍රශ්නාදී වාර්තාවලින් එය පිරී තිබිණ. මමද ඉහත සඳහන් වැකිය ''ඔබගේ සුවය පතා - අන් කිසිදෑ නොපතා'' යනුවෙන් ලියා, මා විසින් සටහන් කරන ලද මුදල ඔහු අත තැබිමි.

රෝගී තරුණයා මා ලියා තිබු වැකිය දෙස නෙත් යොමා බැලීය. ඔහුගේ දෙනෙත් කඳුලින් පිරී තිබෙනු දක්න්ට ලැබිණ. එය මට අදහාගත නොහැකි කරුණක් විය. ඔහු ''තාත්තේ'' යැ'යි මා ඇමතීය. එසේ අමතනවාට මා අමනාප දැ'යි ද විමසීය. පසුව ඔහු මගේ දෙපතුල අල්ලා වැඳ වැටී මෙසේ කීය. ''අපේ තාත්තා මුළු සේසතම මගේ ලෙඩේට වියදම් කළා. ඒ මගේ සුවය මිස, අන් කිසිවසක් පතා නොවේ. තාත්තාද එසේම'' යැයි කියා මට වැඳ නමස්කාරකොට පැමිණි පිරිසත් සමග හේ යන්නට ගියේය.

ඔහුගේ මෙම ප්‍රකාශය දීර්ඝ කාලීනව මගේ සිතිවිල්ලක් බවට පත්විය. අප යම් රෝගියෙකුට ආධාරයක් කරනුයේ මුඛ්‍යාර්ථයෙන්ම එම රෝගියාගේ සුවය පතා නොව, තම පවුලේ අන්‍ය රෝගියෙකුගේ සුවය පතා හෝ ස්වකීය දූරියකගේ විභාග සාමාර්ථය පතා හෝ ඊළඟ ආත්මයේ පිං පිණිස හෝ අන් ප්‍රතිලාභාපේක්ෂාවකින් නම් එහි තේරුම කුමක්ද' යි මට සිතිණ. මෙය භව තණ්හාවේ හෝ විභව තණ්හාවේ එක්තරා ස්වරූපයක් පමණක් දැ'යි ද නැතහොත් තමාගේ දුක්ගිනි නිවාලීමේ චේතනාවෙන් පමණක් කරනු ලබන්නක් දැ'යි ද සිතිණ. එහෙත් මවක හෝ පියෙකු තම රෝගී පුත්‍රයා වෙනුවෙන් ක්‍රියා කරනුයේ මෙබඳු කිසිවක් අපේක්ෂාවෙන් නොව, තම පුත්‍රයා කෙසේ හෝ සුවපත් කරගැනීමේ ඒකායන චේතනාවෙන්ම පමණි. අප අන්‍ය රෝගියෙකු සම්බන්ධයෙක් වුවද මුදලක් පරිත්‍යාග කළ යුත්තේ. එබඳු චේතනාවෙන් පමණි.

''මාතායාථා නියං පුත්තං - ආයුෂා එක පුත්තමනුරක්ඛෙ
එවංපි සබ්බභූතේසු - මාන සම්භාවයෙ අපරිමානං"

යනුවෙන් ප්‍රකාශ වනුයේ ද මේ හා සමාන වූ අර්ථයකි. මවක යම්සේ තමාගේ එකම පුත්‍රයා ආයුෂයෙන් (දිවිපුදා නමුත්) රක්නේද, එපරිද්දෙන් සියලු සත්වයන් කෙරෙහි අපිරිමිත වූ කරුණාව දැක්විය යුතු" යනු මෙහි අර්ථයයි. බෞද්ධ ඉගැන්වීම වූ කලී මෙයයි. ඒ අනුව තමාවෙත ආධාර පතා එන අසරණයෙකුට අප පිහිට විය යුත්තේ, එකී අසරණයා කෙරෙහි ඇති වූ අපරිමිත කරුණාවෙන් පමණි. නැතහොත් ස්වකීය භව තණ්හා හෝ විභව තණ්හා පිං කැටය කෙසේ හෝ පුරවා ගැනීමේ අභිලාෂයෙන් හෝ ස්වකීය අන්‍යරෝගියෙකුගේ සුවය පතා නොවිය යුතුය. බෞද්ධ චින්තනය යනු - එයයි.

චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන්නෙන් ප්‍රකාශ වනුයේද භික්ෂුනි, චේතනාවම මම කර්මය (ක්‍රියාව) කොට දක්වමි" යන්නයි. මෙසේ බෞද්ධ චින්තනය අනුව, චේතනාව හා ක්‍රියාව එකිනෙකින් වෙන්කොට ලිය නොහැකිය. මේ අනුව අසරණයාට පිහිට වීමේ ක්‍රියාව හා චේතනාව එකක්ම විය යුතු වේ.

Plate of Gold" නම් වූ සම්භාව්‍ය ඉංග්‍රීසි කාව්‍යයෙන්ද මෙබඳුම අදහස් ප්‍රකාශිතය. රන් තලිය ලබා ගැනීමේ චේතනාවෙන් අධික ධනස්කන්ධයක් වියදම් කොට දුගී මගී යාචකාදීන්ට ගෙවල් දොරවල් ඉඩකඩම් යාන වාහනාදියෙන් සංග්‍රහ කොට විවිධ පුදපූජාදිය ද පවත්වා, පෝලීමේ මුල්තැන අපේක්ෂාවෙන් දෙවියන් වහන්සේගේ පාමුල සොයා ඔවුහු කඳු මුදුනට දුවන්නට පටන් ගත්හ. රන් තලිය ලබා ගැනීමේ තණ්හාවෙන් මඩනා ලද සිතින් යුතුවූ මග දෙපස සිටි දුගී මගී යාචකාදීන් දෙස පවා නොබැලූහ. ඔවුන් කෙරෙහි දයාවක්, කරුණාවක් ඔවුන්ගේ සිත්තුල ජනිත නොවීය.

දෙවියන් වහන්සේ විසින් ඔවුන් සියලු දෙනාගෙන් තම තමන් කරුණාහරිතව දුගී මගී යාචකාදීන්ට කරන ලද අනන්ත අප්‍රමාණ සත්කාරයන් ගැන විමසන ලදි. ඔවුහු තම තමන් කරන ලද ඒවා ප්‍රකාශයට පත් කළහ. අවසානයේදී ඔවුන් ඒ හැමෙකක්ම කරන ලද්දේ, කරුණා පෙරදැරිය නොව, තෘෂ්ණාහරිතව රන් තලිය අපේක්ෂාවෙන් එය ලබා ගැනීමේ චේතනාවෙන් පමණක් බැව්, දෙවියන් වහන්සේගේ නිගමනය

විය. එහෙයින් රන් තලිය ඔවුනට අහිමි බැව් දෙවියන් වහන්සේ විසින් ප්‍රකාශයට පත්කරන ලදි.

මේ අතර එක්තරා පුද්ගලයෙක් යන්නත් වාලේ මේ ගමනට පිටත් විය. ඔහු ආහාර පානාදී කිසිවක් නොලබා, නිරාහාරව, කිළිටි වස්ත්‍ර හැඳ, ගමන් මගෙහි වැතිරී සිටින මහලු දුගියෙකු දැක දුගියා කෙරෙහි ඇතිවූ අනුකම්පාවෙන් හා දයාවෙන් යුතුව ඔහුට කවා පොවා නහවා, ඇඳුම් පැලඳුම් ආදියෙන් සංග්‍රහකොට අවසානයේදී, රන් තලිය ලබා ගැනීම සඳහා දෙව්පාමුල කරා යන්නට විය. යාචක දුගී සත්කාරයන් නිසා ඔහුට සිදුවූයේ පෝලිමේ අන්තිමයා වීමටය. ඔහුගෙන් රන්තලිය ලබා ගැනීමේ සුදුසුකම් වශයෙන් දුගී මගී සත්කාරයන් කිසිවක් කොට ඇත්දැයි දෙවියන් වහන්සේ විසින් විමසන ලදුව, එසේ කොට නොමැති බැව් හේ පැවසීය. එහෙත්, ප්‍රමාදයට හේතු වූයේ, තමන් පැමිණි මහමග ආහාරත් නොමැතිව බිම වැතිරී සිටි දුගියෙකු දැක ඔහු කෙරෙහි ඇති වූ අනුකම්පාවෙන් හා දයාවෙන් ඔහු නහවා ආහාර පානාදියෙන් හා ඇඳුම් පැලඳුම් ආදියෙන් සත්කාරයෙන් කිරීම නිසා යැ'යි කීය. දෙවියන් වහන්සේ ඔහු විසින් කරන ලද සත්කාරයන් රන් තලිය කෙරෙහි තෘෂ්ණායෙවන් නොව, දුගියා කෙරෙහි ඇතිවූ නොකිලිටි අනුකම්පා සහගත චේතනාවෙන්ම කරන ලද්දක් වූ හෙයින් රන් තලියේ නියම හිමිකරු ඔහු බැව් පවසා ඔහුට රන් තලිය පරිත්‍යාග කළ සේක. ක්‍රිස්තියානි දේව කථාවක් ආශ්‍රිතව එන මෙම පුවත බෞද්ධ චින්තනය හා බොහෝ සෙයින් සමාන වූ එකකි. අප බෞද්ධයෝ චේතනාවට වඩා ක්‍රියාව බහු ආනිසංසවාදී එකක් නම් ඊට ප්‍රමුඛත්වය දෙති. එය ඊළඟ ආත්මයේ මහා සැප සම්පත් ලබා දෙන්නක් බවට ඔවුන් තුළ පවත්නා දැඩි විශ්වාසය නිසයි. මෙය දේශනාදියෙන්ද, පොතපතින්ද ආනිසංසාදී මහා පුණ්‍ය කර්ම වශයෙන් තහවුරු කොට තිබීමද එක් හේතුවකි. අප පන්සලේ එක්තරා මහෝපාසිකාවක් දිවවිත් මා හමුවී, මහත්තයා කඨින පිංකමට නම දාගත්තාද'යි මගෙන් ඇසීය. ගිහින් ඉක්මනට නම දාගන්න. මේ පන්සලේ නම් ලැයිස්තුව දැනටමත් 2025 වර්ෂයෙන් ඉවරයි. අසවල් පන්සලේ පොතේ නම් ඉඩ තියෙනවා" යැයි ඇය කීයේ මා කෙරෙහි පවත්නා අචල අනුකම්පාවෙනි. එසේ කියා කඨිනයක් පූජා කිරීමෙන් ලබන්නාවූ ආනිසංස නම් වූ මුද්‍රිත පත්‍රිකාවක් මා අත තැබීය. එහි තිබූ වැකි කිහිපයක් මෙසේය.

1. සතර සාගරය කෙළවරකොට පවතින සක්වල පච්ච ඇතුළත මුළු පොළවම සුදුපාට වස්ත්‍රවලින් වසන්නට වූවත් පොහොසත් වීම.
2. සක්දෙව් රජ පදවි ලැබීම.
3. සක්විති රජ සම්පත් ලැබීම.
4. ඒ ඒ ප්‍රදේශයන්හි අධිපතිබව හෙවත් ප්‍රදේශ රජ සම්පත් ලැබීම.
5. දිව්‍ය ලෝකයෙහි හා මනුෂ්‍ය ලෝකයෙහි පමණක් උත්පත්තිය ලැබීම ආදී වශයෙනි.

මෙවැනි ආනිසංසාදිය අසුවක් එහි දක්නට ලැබිණ.

මෙම පත්‍රිකාව කියවා නූගත් උපාසක අම්මා කෙනෙකුට දෙව්ලොව යාමේ තෘෂ්ණාව හා මහා සම්පත් ලැබීමේ ආශාවෙන් මඬනාලද තෘෂ්ණාවක් ඇතිවීම ස්වාභාවිකය. එක්තරා උපාසක අම්මා කෙනෙක් පන්සලේ විහාරාධිපති ස්වාමීන් වහන්සේ බැහැදැක හාමුදුරුවනේ කඨිනෙට මගේ නම තියෙන්නේ ලබන අවුරුද්දට"දැයි විචාලාය. උන්වහන්සේ පොත බලා කියන්නම්" යයි කී විට මැයට කේන්ති ගියා පමණක් නොව මං කඨිනෙට ඉස්සර වෙලා මළොත් ඔබ වහන්සේ වගකීම භාරගන්නට ඕනෑ"යැයි ද කීවාය. උගත් යති නමක් වූ උන්වහන්සේ සිනා සෙන්නට වූහ. කඨින පිංකම් සම්බන්ධයෙන් අප බෞද්ධ උපාසක උපාසිකාවන් තුළ පවත්නා චේතනාව කුමක්ද'යි යන්න මින් මනාව වටහා ගත හැකියි. බෞද්ධ දර්ශනයත්, ආනිසංසවාදී ඇදහීමේ සංකල්පයනුත් මෙසේ එකිනෙකට පරස්පර විරෝධී ස්වභාවයක් ගන්නා බැව් පෙනේ. අප කඨින චීවරයක් බුද්ධ පුත්‍රයාණන් වහන්සේට පූජා කරනුයේ උන් වහන්සේ කෙරෙහි ඇති අචල භක්තිය නිසා විනා ඉහත කී කඨිනානිසංස අපේක්ෂාවෙන් නොවිය යුතුය. අප විසින් කරනු ලබන වන්දනාමානාදිය දෙස බලන කලද චේතනාවත් වන්දනාමානාදියත් අතර ඇත්තේ භක්ති පූර්වතාවයට වඩා තෘෂ්ණාහරිත බවකි. බොහෝ අය භය ත්‍රස්තය නිසා යමක් ඉටුකරගැනීම සඳහා ආරාම, රුක්, චෛත්‍ය පර්වත හා වනාන්තර වන්දනා කරති. ඒවායේ සරණ යති. මෙය බුදුන් වහන්සේ පලක් නැති, උතුම් නොවන සරණ යාම් වශයෙන් වදාල සේක.

බහුං වෙ සරණං යන්ති - පබ්බතානි වනානිච
ආරාම රුක්ඛ චෙතියානි - මනුස්සා භය තජ්ජිතා"

භක්තිපූර්වකව බෞද්ධයා විසින් කරනු ලබන රුක්ඛ චෛත්‍යය, හා ආරාම වන්දනාදිය අන්‍යවූ භය හා ත්‍රස්තයන් දුරුකිරීමේ චේතනාවෙන් නොවිය යුතුය. කට්ටඩියාගේ කීම පිට දරුවාගේ අපල දුරු කිරීම සඳහා සත්දිනක් මහවැස්සේ කුඩය හිසලාගෙන ගොස්, වතුර කළගෙඩි හතක් බෝගසට වත් කිරීම වැනිදේ බෞද්ධ ඉගැන්වීමේ වලට අනුකූලයැයි කිව නොහැකිය. එක්තරා විහාරස්ථානයක බෝ අතුවල සුදු පාට රෙදිකඩ වලින් තැනින් තැන මුදල් ගැට ගසා තිබෙනු දක්නට ලැබුණි. ධජ කිහිපයකම දක්නට ලැබුණේ ........ගේ අපල දුරු වේවා" යන්නයි. තවත් තැනක දියණියගේ දරුගැබ ආරක්ෂාකරදෙනමෙන්" ලියා තිබිණ. මේවා අචේතනික වූ බෝධි රුක්ඛයකට අදාළ කාර්යයන් නොවේ. මේවා බලාපොරොත්තුවෙන් බෝධි වන්දනා කළයුතු නොවේ. බෝධි වන්දනා සිය භක්ති පූර්ව හැඟීමෙන් පමණක් කළ යුතුවේ.

එසේ නම් අප සරණ යා යුත්තේ කුමක්ද? බුද්ධ, ධම්ම හා සංඝ රත්නයයි. ඉන් චතුරාර්ය සත්‍ය අවබෝධය සහිත ඥානය ලබාගත හැකිය.



**රා.මු. සෙනෙවිරත්න. (767)**
**0112 845054**

# සහනය සොයා

උදෑසන පොළොන්නරු බලා දෙහිවලින් පිටත් වූ වෑන් රිය තුළ, ගමනේ ප්‍රබෝධය පෑ නා නා ගීත, ප්‍රිය සල්ලාප දැන් ඇසීමට නැත. වේගයෙන් ඉදිරියට ඇදෙන රිය තුළ කාටත් කාන්සිය මෙන්ම දිවා ආහාරයේ ඌවමනාව දැනී තිබුණි. ඒ අතර අපි සුන්දර පරිසරයක් මැදින් ගමන් කරන්නට වීමු. රිය පැදවූ තරුණයා ඊටම සුදුසු පාර අයිනේ තැනක දිවා ආහාරය සඳහා වෑන් රිය නැවතීම කාගේත් සහනයට සහ සතුටට හේතු විය.

ගමනට මා කැඳවා එක්කර ගත් මගේ මිතුරා තරමක මත් පැන් ලෝලයෙකි. ආහාරයට කලින් පිරිමි කීප දෙනෙකු සමග මදුවිත පානයට ඔහු සූදානම් විය. ඊට එක්වීමට අකමැති වූ මම ඔවුන්ගේ සතුටට ඉඩහැර මදක් වෑන් රියෙන් ඈත්ව අවට සිරිය වෙත යොමු වීමි. හාත් පස අවකාශයේ නිදහස ද රකිමින් අවට කඳු කීපයක් හරිත පැහැයෙන් දකුම් කළුව අහසට උස්විය. දිවා නිලඹර සේද වලා සහිතව පෙනින. ඉගිලෙන නොයෙක් පක්ෂින් හමන සුළං රැලි සිතට සිරියත් ගතට සුවයත් ඇති කළේය.

වෑන් රිය අසල නිදහස් බිමේ ඔබ මොබ ඇවිද ගිය මා සනව වැඩී පඳුරු පේලියක අවසානයට යත්ම ප්‍රදේශයේ කෙනෙකු දකිනට ලැබුණි. සරමක් බැනියමක් ඇඳ සිටි ඔහු දෙස මම පරීක්ෂාවෙන් බැලීමි. දසුන මට අදහා ගත නොහැකි විය.

''රංජිත් සිරිවර්ධන, මචං රංජිත් උඹ කොහෙද මෙහේ ?'' මට කෑ ගැසින

''ඔව් දිනේෂ්, මං දැන් මෙහෙ තමයි ඉන්නෙ''

''හුඟක් දවස් ඉඳලද?''

''ඔව් දැන් අවුරුදු දෙකක් වෙනව, අර තියෙන්නෙ ගෙදර, මේ කොහේ යන ගමන්ද? යමු ගෙදරට ටිකක් කථා කරන්න.''

ඉක්මනින් වෑන් රිය වෙත යා යුතුව තිබුණත් රංජිත් ගැන කල්පනාවෙන්ම මම ඔහුගේ ගෙදරට පිය නැගීමි. එහි අසුනක වාඩිගත් පසුව කාලය අමතකව කුතුහලයට ඉඩදීමට පෙළඹුනෙමි. රංජිත් මා සමග කලක් එකම රජයේ ආයතනයක සේවය කර මා මෙන්ම සේවයෙන් ඉසිඹු ලද්දෙකි. එකල ඔහු සිටියේ කිරිබත්ගොඩ නගරයේ ඔහුගේම සුව පහසු නිවසකය. මා එහි ගොස් ඇති වාර ගණනද කිහිපයකි.

''මොකද රංජිත් මෙහෙ එන්ඩ හිතුනෙ ?, මට නම් හිතා ගන්ඩ බෑ''

'' ඔහොම තමයි ජීවිතේ, එක එක විදිහට තීරණ ගන්ඩ සිද්ධ වෙනවා''

''ඒක එහෙම උනත් මේ වාගෙ පහසුකම් අඩු තැනකට එන්ඩ මොකක්ද හේතුව?''

''නිකම් හිතුන. දවසක් මම කට්ටියක් එක්ක මේ පාරෙන් යද්දි මේ හරියෙම නැවතුනා. මට මේ නිදහස් පරිසයට හිතක් ඇති වුනා''

එය ඇසූ මම රංජිත්ගේ මුහුණ දෙස බලා සිටියෙමි. එයින් ඔහු කී හේතුව මම විශ්වාස නොකළ බව ඔහු සිතුවා විය හැක. මොහොතක් නිහඬව සිට රංජිත් යළිත් කථා කළේය.

''මචං ඒ දවස් වල අපි මොන රහස්ද කථා නොකළෙ? ඇත්තම කියන්න දිනේෂ් මට පෙන්ෂන් අරන් ගෙදර ඉන්නකොට කරදර ටිකක් ආවා, ඒ දේපොල සම්බන්ධයෙන්. මගෙ පුතාල දෙන්නයි, දුවල දෙන්නයි නෙ. එක පුතෙක් බැඳල පදිංචිව හිටියෙ කුලී ගෙදරක, අනිත් පුතාට එයාගෙම ගෙයක් තියෙනව. දූලගෙනුත් බැඳල කරදරයක් නෑ. කුලියට හිටි පුතා මගෙ ගේ ඉල්ල ඉල්ලා කරදර කරන්න උනා. එයත් එයාගෙ බිරිඳත් එක්ක කොහොමටවත් එකට ඉන්න බැරි බව අපි දෙන්නට හිතුනා. අනික ගේ ඔහුට දුන්න නම් අනිත් තුන්දෙනාට කිසිම දෙයක් දෙන්න ලැබෙන්නෙ නෑ.''

''මම අවුරුද්දකටත් වැඩිය ඒ ගැන හිතින් කරදර වෙවී ඉඳල තීරණයක් ගත්ත. මගේ ගේයි ඉඩමයි විකුණල මට පොඩි මුදලක් ඉතිරි කරන් ලොකු කොටස ළමයි හතර දෙනාටම බෙදල දුන්න. ඒකෙන් මගේ හිතට ලොකු සහනයක් ඇති උනා. මම තියා ගත්ත මුදල මම හිටපු පැත්තෙම ගෙයක් ගන්න මදි උනා. ඊට පස්සෙ කලින් දැක. හිත ගොස් තිබූ කමට මෙහෙට ආව. මේ ගේත් අරන් අතේ ගානක් ඉතුරුත් උනා. එහෙ තිබුණ පහසුකම් නැතත්, ලැබෙන පෙන්ෂන් එකෙන් ජීවත් වෙන්න පුළුවන්, නිදහසේ... මෙහෙ වියදනුත් අඩුයි.'' රංජිත් කථාව අවසන් කළේය.

මගේ හිතට වන් ශෝකී හැඟුම මා විනාඩි දෙක තුනක් නිරුත්තරව තැබීය. ඉන් පසුව ''ඉතින් මෙහෙ පාලුව තනිය දැනෙන්නෙ නැද්ද?'' මම ඇසීමි.

''ආව මුලදි නම් එහෙම තිබුණ. දැන් එහෙම නෑ'' මා ඉක්මනින් වෑන් රිය වෙත යා යුතු බව සිහි විය. එසේ වුවද රංජිත් ගෙන තිබූ පියවර ගැන කිසිත් නොදොඩා යාමට මගේ සිත එකඟ නොවීය.

''මොනව උනත් රංජිත් ඔයා අරගෙන තියෙන පියවර හොඳද මන්ද, ඉදිරි වයෝවෘද්ද බැරිකම්, ලෙඩ රෝග පෙනෙන තෙක් මානයේ සිට ඇයි මෙහෙම පාළු ප්‍රදේශයකට පදිංචියට ආවේ? නිදහස් නිස්කලංක බව ඇත්ත. ඇත්තම කියනව නම් මට ඔයාල දෙන්න ගැන දුකත් හිතෙනව'' මගේ සිත තුළට ගොනුවූ සැක සංකා මුසු කණගාටුව මැත්වී මගෙන් පිටවිය.

''කරන්ඩ දෙයක් නෑ දිනේෂ්, වෙලාවෙ ආවේගයටත් එක්ක කළ යුතු දෙය කළා. අපට හැකි හැම දෙයක් කරමන් ඇති දැඩි කළ ළමයි ආත්මාර්ථයෙන් වෙනස් කම් පාන කොට ඉවසීම අමාරුයි. තව ටික දවසකට හරි මෙහෙම ඉඳීම හොඳයි. අනික මේ පලාතෙත් මිනිස්සු උපදිනව, වැඩෙනව, හොඳ කාලෙ ගෙවනව, වයස් ගතව මැරෙනව. නගරවල තිබෙන පහසුකම් නැතුවට ඒ අයත් ජීවත් වෙනව''

රංජිත්ගේ කථාවෙන් ඔහු තම පරිසරය හා එකඟතාවයකට පිවිස ඇති බව මට සිතුනි. ජීවත් වීමට වැදගත් දෙයත් එයම බව මටද හැඟී ගොස් මම කිසිවක් නොකීවෙමි.

නිහඬව වට පිට බැලූ මට කබඩ් එකක් මත නාරි චිත්‍ර දෙකක් නෙත ගැටුනි. කලක සිට රංජිත් චිත්‍ර අඳින්නෙකි. ඔහු වැඩියක් අඳින්නේ ස්ත්‍රී රූපය. එහෙත් ඔහු ස්ත්‍රී ලෝලියෙකු නම් නොවේ. ස්ත්‍රී කෝමල ලාලිත්‍ය චිත්‍රයට නැඟීමට ඔහු සමතෙකි.

රංජිත් සම්බන්ධයෙන් දුක් මුසුවූ මගේ සිතට, ඔහු හා කථා කර නික්ම යාමට සැහැල්ලු මාතෘකාවක් ඔහුගේ චිත්‍ර මට ලබා දුන්නේය.

''රංජිත් තවම චිත්‍ර ඇඳීම කරනව වගෙයි. අර චිත්‍ර දෙක ලස්සනයි.''

''ඔව් තවම අඳිනව. මෙහෙ තිබෙන නිහඬ නිස්කලංක ගතිය ඒකටම ගැලපෙනව''

''ඉතින් ඔය තරම් අඳින චිත්‍ර වලට මොකද කරන්නේ?'' මම ඇසීම.

''හොඳ හොඳ ඒව මම මෙහොට ලග ටවුමෙ තැනකට විකුණනවා''

''ඒක හොඳයි. ඔයාගෙ ඇඳීමත් කෙරෙනව ආදායමකුත් ලැබෙනව. අපි ලබා උපන් හැකියා වර්ධනය කරමින් ඉදිරියට ගෙන යාම ජීවිතේට ලොකු තෘප්තියක්. රංජිත් දැන් මම යන්ඩ ඕනි. මාව හොයමින් ඇති.'' එසේ පවසා මම රංජිත් දෙපොලට සුබ පතා ඔවුන්ගෙන් සමුගෙන වහ වහවැන් රථය වෙත ගියෙමි.

එහෙත් ගමන තුළදීත් ඉන් පසුවත් රංජිත් සිහිව මගේ සිතෙහි දුකක් ඇතිවිය.


**ඩබ්.ඩී.ඒ. රේමන්ඩ්. (554)**
**011 2231357.**
**077 1010946.**




# නව විධායක කමිටුව - 2015

**ගරු සභාපති** - **ලක්ෂමන් ද සිල්වා මහතා**

**ගරු ලේකම්** - **ජයලාල් ජයවර්ධන මහතා**

**ගරු භාණ්ඩාගාරික** - **මිලන් ප්‍රනාන්දු මහතා**

**ගරු උප සභාපති** - **ආරියදාස තන්තිරිගේ මහතා**

**ගරු උප ලේකම්** - **අමරපාල කරසිංහ ආරච්චි මහතා**

**ගරු උප භාණ්ඩාගාරික** - **ආර්.ඩී. ගුණසේන මහතා**

**ගරු විධායක කමිටු සභිකයින් ඃ**

- **ලීලා මෝහනසුන්දරම් මහත්මිය**
- **ජගත් කාරියවසම් මහතා**

**(විධායක කමිටු සභික සේ.දෝ. කරුණාරත්න මහතා ඉල්ලා අස්වීමෙන් පසු)**

- **එල්.එම්.ඩී. කබ්රාල් මහතා**

**(විධායක කමිටු සභික ඩබ්.ඩී.ඒ. රේමන්ඩ් මහතා ඉල්ලා අස්වීමෙන් පසු**

**ගරු සමාජයීය ලේකම්** - **අයිරා වෑගොඩපොල මහත්මිය**

**ගරු ගිණුම් පරීක්ෂක** - **කේ. ජෙගනාදන් මහතා**

## මතකයට පුසුඹ පළමු පෙම ගැන කාව්‍ය සංවාදය.......



# කවි මඬුව



## ප්‍රථම ප්‍රේමය

හිඳිමි අභියස මකර තොරණේ
පෙනෙයි මට කොත කැලණි වෙහෙරේ
නගින්නට පිය ගැට පෙළේ
වාරු නැහැ දෙපයේ මගේ

දකුණතින් ගෙන යකඩ අත්වැල
වමත රඳවා ඇය අතේ
නැවති නැවතී තැනින් තැන සිට
නගිමි පිය ගැට පෙළ දිගේ


බෝධි පූජා පොත් පෙළක්
තබාගෙන ඇය ඉදිරියේ
සිටියි කිසිවෙක් අවුරමින් මඟ
මා නගින පිය ගැට පෙළේ

නෙත් කෙවෙනි තුළ ඉඳුණි කඳුලැල්
කවුද මට මේ හමුවුණේ
පහන් විය ඇග මිළින නෙත් යුග
අසන්නී ඇය ''කවුරු සමගද පැමිණියේ''

බිරිඳ හා මගෙ සිනාසුන ඇය
නැවත බැලුවා මා දිහා
ඇගේ නෙත්වල කඳුළු පිරුවා
අප ඇගෙන් සමුගෙන ගියා

'ප්‍රථම ප්‍රේමය' ඇයයි මාගේ
නිවුණු පහනකි පන්සලේ
තවදුරයි කොත කැලණි වෙහෙරේ
නගිමි පියගැට පෙළ දිගේ

**ටී. ඒ. ජී. ගෝමිස්**
**(624)**
**011 2926374.**



## ප්‍රථම ප්‍රේමය......

## කෙසේ නම් තෝරන්න ද?

1. පොඩි කාලෙදි නො තේරුණු මට සැපක් දුකක්
ප්‍රේමය පුදන්නට ලස්සන ළමුන් ටිකක්
ළං කර ගතිමි, මුල් පෙම ලෙස එයින් ටිකක්
කොහොම ද? තෝරන්නෙ අතරින් දුසිම් දෙකක්

2. පසලොස් වියෙහි සිට පෙම් සුව විඳින්නේ
හැත්තෑ අටේ වසරයි මේ ගෙවෙන්නේ
වසරක් පමණි, පෙම්වතියක සිටින්නේ
කොයි අවුරුද්දෙ මුල් පෙම ව ද? අසන්නේ

3. අසල් වැසිට පෙම් කරනු ය දැක පොතක
අසළ ම නිවෙස් තෝරා ඉන් හත අටක
පෙම පිදුවෙමි. ළඳුන් රැසකට එක වරෙක
මුල්පෙම එයින් කා හට දැයි කිව නොහැක


4. අවුරුදු දහ අටක් බැංකුවෙ සිටින විට
පෙම්වතියන් රැසක් සිටියහ හතර වට
ඉන් විස්සක් තිහක් අතරින් බලන කොට
කෝක ද? ප්‍රථම ප්‍රේමය කිව නොහැක මට

5. මා පෙම් කළ අයද, මට පෙම් කළ අයද
යනුවෙන් දෙ කොටසකි, කිම? එහි ඇති වරද
එයිනුත් එකක් මුල් ප්‍රේමය ලෙස සබඳ
තෝරා ගන්න හැටි ගැන මට කිව හැකි ද?

6. තෝරා ගෙන එසේ අඟනුන් සොඳුරුතම
මා පෙම් කළත්, පුදමින් මුළු හදවතම
ඒ බව ඔවුන් නොදනිති, මේ වනතුරුම
එහෙයින් අදත් සැනසිල්ලේ සිටිමි මම



**ලාල් හේවාපතිරණ (151)**
**071 4357606**



# Our Solar System



Last issue of sandewa, I placed before you about the universe, especially on the Milky Way Galaxy. In this issue I will speak about the Solar System. The whole solar system, together with the local stars visible on a clear night, orbits the center of our home galaxy, a spiral disk of 200 billion stars, we call the Milky Way. Our solar system occupies a tiny place in the Milky Way galaxy. Our solar system consists of sun, the planets Mercury, Venus, Earth, Mars, Jupiter, Saturn, Uranus, Neptune and Pluto. Planets and their 172 known moons, asteroids, comets, dust and gas, all travel around the sun. The sun's nearest known stellar system is Alpha Century, at a distance of 4.4 light years away.

The SUN

Sun is the largest object and contains approximately 98% of total solar system mass. One Hundred and nine Earths would need to fit across the sun's disk, and its interior could hold over 1.3 million Earths. The suns' outer layer is called the photosphere and has a temperature of 6000C (11000F) Solar energy is generated deep within the core of the sun. The temperature is around 15000C; 27000F and pressure is around 340 billion times Earth's air pressure at sea level

SUN'S CORE

The energy generated in sun's core released as light and heat. Energy so released in the sun's core takes a million years to reach its surface. Every second 700 tons of hydrogen are converted into helium ashes, in the process 5 million tons of pure energy is released; therefore, as time goes on the Sun is becoming lighter.

SUNSPOT

The chromospheres are above the photosphere. Solar energy passes through this region on its way out from the center of the Sun. These bright luminous hydrogen clouds are about to form sunspots. Sunspots are dark depressions on photosphere with a temperature of 4000C (7000F).

THE CORONA

The corona is the outer part of the Sun's atmosphere. It is in this region that prominences appear. Prominences are immense clouds of glowing gas that erupt from the upper chromospheres. The outer region of the corona stretches far in to space and consists of particles traveling slowly away from Sun. The corona can only be seen during total solar eclipses.

The Sun appears to have been active for 4.6 billion years and has enough fuel to go on for another 5 billion years or so.

The end of Sun's activity

At the end of its life, the sun will start to fuse helium into heavier elements and to begin to swell up, ultimately growing so large that it will swallow the Earth. After a billion years as a red giant, it will suddenly collapse into a white dwarf. It may take a trillion years to cool off completely.

MERCURY

Mercury was named by the Romans because it moves more quickly than any other planet. It is the closest planet to the Sun, and second smallest planet in the solar system. The diameter is 40% smaller than Earth and 40% larger than the Moon. The explorer would notice that the Sun appears two and a half times larger than the Earth because of the closeness to the Sun. It is even smaller than Jupiter's moon Ganymede and Saturn's moon Titan. However, the sky is always black because Mercury has no atmosphere to cause scattering of light.

Most of the scientific findings about Mercury come from the Mariner 10 spacecraft which was launched on November 03rd 1973. It flew past the planet on March 29, 1974, September 21st 1974 and 16th March 1975, at a distance of 705 km from the surface of the Mercury. During these visits, over 2700 pictures were taken, covering 45% of Mercury's surface. With pictures scientists knew that mercury has a magnetic field. The presence of magnetic field indicates that the planet has an iron core that is at least partially molten. Magnetic fields are generated from the rotation of a conductive molten core and known as the dynamo effect.

The pictures received from Mariner 10 space craft indicates the Mercury is packed with craters, contains multi ring basins and lava flows. The craters range from 100 meters to 1300 kilometers. They are in various stages of preservation. The largest crater is the Caloris basin, which is 1300 kilometers in diameter. The mercury's surface is covered by plains. Scientists have classified these plains as intercrater plains and smooth plains. Mercury's formation was similar to formation of Earth, about 4.5 billion years ago.



Jayalal Jayawardena

**011 2601383**

**0777 412289.**

# මහ බැංකු විශ්‍රාමිකයින්ගේ ස්තුතිය හා ප්‍රණාමය

මහ බැංකු විශ්‍රාමිකයාට බොහෝ කලක සිට, කිසිම විශ්‍රාම වැටුප් වැඩිවීමක් නොලැබීම හේතු කොට ගෙන, ඔවුන් තම ජීවනාලිය ගැට ගසා ගත්තේ ඉතාමත් අසීරුවෙන් බව අපි කවුරුත් දනිමු. මේ කාලය තුළ රටේ බඩු මිල හැම ලෙසකින් ම ඉහළ ගිය බව ද බැංකුකරුවන් වශයෙන් අපි දනිමු.

අපගේ විශ්‍රාම වැටුප් විෂමතා සංශෝධනය කර ගැනීමටත්, සියලුම මහ බැංකු විශ්‍රාමිකයින්ට සාධාරණ වැටුප් වැඩිවීමක් ලබා ගැනීමටත් අප සංගමයේ සභාපති ඇතුළු විධායක මණ්ඩලය පසුගිය අවුරුදු ගණනාවක සිට නොගත් උත්සාහයක් නැත. මේ ගැන එදා හිටපු මහ බැංකු අධිපති ඇතුළු අදාල මහ බැංකු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට කොතෙක් කන්නලව් කළ ද, ලැබුනේ කුඩම්මාගේ සැලකිලි පමණය. එම සාකච්ජා බිහිරි අලින්ට වීණා වැයීමක් විය.

එහෙත් නව මහ බැංකු අධිපති, අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා සහ මහ බැංකු නියෝජ්‍ය අධිපතිවරු හා අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ කරන ලද සාකච්ඡා වල ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය ජනවාරි මාසයේ සිට අප සියලු මහ බැංකු විශ්‍රාමිකයන්ට සහ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමිකයින්ට ද කිසියම් විශ්‍රාම වැටුප් වැඩිවීමක් ලබා ගැනීමට හැකිවිය. මෙම විශ්‍රාම වැටුප් වැඩිකර දීම ගැන අපේ ගෞරවනීය ප්‍රණාමය සහ ස්තුතිය මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ ගරු සභාපති ලක්ෂමන් ද සිල්වා මහතා ප්‍රමුඛ සංගමයේ සියලු විධායක මණ්ඩල සභිකයන්ට පළකර සිටින්නෙමු.

තවද අපගේ මහබැංකු නව අධිපති අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමාට සහ මේ පිළිබඳව කටයුතු කළ නියෝජ්‍ය සහ සහකාර අධිපතිවරුන් ඇතුළු සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ද අපගේ ගෞරවනීය ප්‍රනාමය සහ ස්තුතිය පුදකර සිටින්නෙමු.

මෙයට අමතරව විශ්‍රාමිකයින්ට වැටුප් වැඩිකිරීමට යෝජනා කළ ගරු අගමැති රනිල් වික්‍රමසිංහ, ගරු මුදල් ඇමති රවි කරුණානායක, සහ විශේෂයෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ද මහ බැංකු සියලුම විශ්‍රාමිකයින් සහ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමිකයින්ගේ ප්‍රණාමය සහ ස්තුතිය පළකර සිටින්නෙමු.

තවද සීඝ්‍රයෙන් ඉහල ගොස් ඇති රෝහල් සහ වෛද්‍ය ගාස්තු වලට ද සමානුපාතිකව ප්‍රතිපාදන වැඩි කර ගැනීමට කටයුතු කරන මෙන් විධායක මඩුල්ලෙන් ඉල්ලා සිටිමු.



**රෙක්ස් ප්‍රනාන්දු (0645)**
**0112 234073**
**072 3464292**

# *Analysis of Anatta*

What is the meaning of the word "anatta"?

The pali word "anatta" is often translated as non-self, non -ego, egolessness, impersonality, and substancelessness.

What is substanceless?

One is oneself substanceless, and all conditioned things around one are substanceless,

In what way is one substanceless oneself?

The human being is actually a combination of material and mental phenomena classified into five vategories or"aggregates". These are:

From
Feeling
Perception
Manral formations
Consciousness
Of these, from is marerial, and the other four are mental phenomena.
How does one regard material phenomena as the self?

The body (as a whole) is regarded as "I" and mine"

When we think, "I sit," "I walk," "I stand," "I lie down,"

We take the whole body, by way of its posture, to be "I".

When we think. "My height is 1.8 meters, "we take the whole body. by way of its dimensions, to be "mine."

Ironically, without a mirror, we cannot even see our whole head, neck or back, yet we claim that our body is our self. Even what we see in the mirror is just a reflection of the body, not the real thing.

Individual parts of the body are reagarded as "I" and "nine"

Some example;

"My hair is shiny": an attached body part (the hair on the head) is taken to be "mine"

"I like to touch silk" : and attched body part (the skin on the plam and figers) is taken to be "I"

"Oops! A stand of my hair has fallen into the soup!" : a detached body part (a stand of hair) is taken to be "mine".

"I am sending my urine sample to the laboratory for analysis" : a detached body part (Urine) is taken to be "mine"



**D. E. Abeyweera (507)**
**0112 913901**

# පිළියන්දලින් යහගුණයක්.



2015 මාර්තු 23 වන දින ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ පිළියන්දල එකමුතුවේ සාමාජික පිරිසක් එකතුවී ඇඹිලිපිටිය කිරලවැල් කටුවේ පදිංචිව සිටින මහබැංකු විශ්‍රාමික එච්.බී. එමානිස් මහතාගේ සුවදුක් බැලීමට ගියෙමු. අප එකමුතුවේ සාමාජිකයින් වන හේමා විමලසෝම, අමරා තිලකරත්න, නීතා පෙරේරා, එම්.ජී. සමරනායක, ජයන්ත ප්‍රනාන්දු, එල්. යූ. කේ. විලේගොඩ, කරුණාතිලක බණ්ඩාර, ඩබ්.එම්.ඒ. විජේසූරිය, විජේරත්න අතුකෝරළ සහ ආර්.එස්.ඩී. කිරි ඇල්ල යන පිරිස සහභාගී වූහ.

එමානිස් මහතා තදබල ලෙස රෝගාතුරව සිට වසර කිහිපයක් ප්‍රතිකාර ලැබීමෙන් අනතුරුව දැනට හැරමිටියක වාරුවෙන් ගෙමිදුලේ ඇවිදීමට තරම් සුවපත්ව සිටී. ව්‍යවහාරමුදල් දෙපාර්තමේන්තුවේ රාජකාරී කරන කාලයේ ඉතා කඩිසරව කටයුතු කළ නමුත් අසනීප තත්ත්වය නිසා දැනට නිවස තුළටම සීමා වී සිටී. එසේ වුවද ඔහුට අප පිරිස දුටු විට ඇති වූ සතුට දෝරෙ ගලා ගියේය. ඒ නිසා නව පණක් ලද පරිදි හැරමිටි වාරුවෙන් වේගයෙන් එහා මෙහා ගියේය. එසේ ගමන් කරමින් අප පිළිගත්තේය. දරුවන් හය දෙනෙක් සිටින උතුම් පියෙකි. එසේ වුවත් රැකියා කටයුතු හේතුවෙන් ඔවුන් සියලු දෙනාටම නිවසින් බැහැරව යෑමට සිදුව තිබූ නිසා තම බිරිඳ සමග නිවසට වී බෙහෙත් හේත් කර ගනිමින් කාලය ගත කරයි. අප එහි යන අවස්ථාවේ අහල පහළ ඥාතීන් කිහිප දෙනෙකු ද පැමිණ අප පිළි ගනිමින් සංග්‍රහ කටයුතු වල නියැලුනහ. මෙවන් අවස්ථාවක් ලැබීම පිළිබඳව මහත් සතුටට පත්ව එමානිස් මහතා අපට වචන කිහිපයකින් ද සංග්‍රහ කළේය.

සතුටු කඳුලු හෙළමින් කතා කළ ඒ මහතා විශ්‍රාම ගැනීමෙන් පසුව අයතනයේ සේවය කළ මහත්ම මහත්මින් පිරිසක් පැමිණීම ඔහුට කියා නිම කළ නොහැකි තරම් සතුටක් හා ගෞරවයක් බවත් ප්‍රකාශ කළේය. අපට ද ඔහුගේ සුවදුක් විමසා පැය කිහිපයක් ගත කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව අපේ සතුට ද ප්‍රකාශ කරමින් ඔහුගෙන් සමුගතිමු. අපේ විශ්‍රාමික මහත්ම මහත්මීන් තම තමන්ට හැකි අයුරින් අසනීප තත්වයේ පසුවන අප සමග එකට සේවය කළ සහෝදර සහෝදරයින්ගේ සුවදුක් විමසා බලන්නේ නම් අගේය. ඒ මෙන්ම ඉඳහිට හෝ ඔවුන් සොයා යෑමට තරම් කාරුණික වන්නේ නම් මහත්ම පිනකි. ඔබේ මානසික හා ශාරීරික නිරෝගීතාවය රැකගැනීමට ද රුකුලකි.



**හේමා විමලසෝම (646)**

**0112 614717 / 071 8328627**



# - නිවන -

නිවන තියෙන්නේ අපි ළඟමයි. වෙන තැනකින් ලබා ගත යුතු දෙයක් නොවේ. අපි නිවන් ලබා ගත යුතු යැයි කියමින් නානා භාවනා කරන තැන් කරා ඇදී ඇදී යන්නෙමු. ධර්ම දේශනයක් තියෙන්නෙ කොතැනද? ඒ තැනට වැල නොකැඩී දුවන සැටි හරිම අපූරුයි. අනන්තවත් භාවනාවල යෙදෙනවා, බණත් අහනවා, කෙලවරක් නෑ. ඒත් කෝ ඉතින් තාමත් නැනෙ මේ නිවන සමීපයටවත් ලං වෙලා.

බණ අහනවා, එනවා එතනින් එය නිමයි. ඒත් අහපු බණක් මතකයේ නෑ. ඉතින් බණ ඇහුවටම මදිනේ. ඒ අසන ලද බණ සිහියට නගා ගන්න එපායැ. ඒකට අපි කියනවා යෝනිසොමනිසිකාරය කියලා. නුවනින් විමසන්න ඕනෑ. නුවනින් විමසල ඒක තම තමන්ගේ ජීවිතයට ඇතුළු කරගන්න ඕනෑ. අන්න එතකොට තමයි තම තමාගේ දිවියට ප්‍රායෝගික වන්නේ.

බුදුපියාණන් වහන්සේ මේ ධර්මය මනාව දේශනා කළ සේක. එම සත්‍ය ධර්මය මේ ලොව සැමදා පවතී. නමුත් එම දහම මතු කර ලෝක සත්වයාට අවබෝධ කරන්නේ බුදුපියාණන් වහන්සේ නමක් විසින්මය. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු මේ දහම් සාසනය ගෙන යන්නේ අපගේ භික්ෂූන් වහන්සේලා විසිනි. ආරක්ෂා කර ගන්නේ උන්වහන්සේලාය. එනිසා අපතුළ නිතර සංඝ ගෞරවය තිබිය යුතුය. සිවුරක් දරාගෙන සිටින කිසිම ස්වාමීන් වහන්සේ නමකට දෝෂාරෝපණය නොකළ යුතුය. මන්ද ඒ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වනහ්සේලා නිසාය. භික්ෂූන්ට දාන මාන ගෞරව නමස්කාර කළ යුතුය. අපගේ සිත් දහමට යොමු කළ යුතුය.

1. බුදුපියාණන් ගැන
2. ධර්මරත්නය ගැන
3. ආර්යමහා සංඝ රත්නය ගැන

නොසැලන නොසෙල්වෙන ශ්‍රද්ධාවක් ඇති කර ගත යුතුය. නිත්‍ය ශීලයක පිහිටිය යුතුය. ගිහියාගේ ශීලය පංච ශීලයයි. මෙයට කියනවා ආර්ය කාන්ත ශීලය කියලා. එම නිසා අපි නිතරම පංච ශීලය ආරක්ෂා කර ගත යුතු වෙමු.

මෙයට කියනවා ශීල විසුද්ධිය කියලා. ඊලඟ කාරනය චිත්ත විසුද්ධිය. චිත්ත විසුද්ධිය යනු සිතේ ඇති කර ගත යුතු පිරිසිදු බවයි. අපගේ සිත නිතරම කිලිටි වන්න බලනවනේ. ඒ නිසා මෙතනදී අප හොඳ සිහි කල්පනාවකින් සිටිය යුතුය.

අප මේ දිවිය ගෙවන්නේ පංච ඉන්ද්‍රියන් වලින්ය. දිවිය කියන්නේ, මේ පසිඳුරන් ගැන හොඳ සිහියෙන් සිටිය යුතුය. ඇස, කණ, නාසය, දිව, කය මේවට එනවනේ අරමුණු, රූප, ශබ්ද, ගන්ධ, රස, පහස කියලා. ඉතින් අපි ඒවයෙ ඇලෙනවනේ, ගැටෙනවනේ, රාග ද්වේශ මෝහ ඇති කර ගනිමින්.

ලස්සන රූපයක් දැක්කොත් එකේ ඇලිලා ඉතින් එහි හැඩතල විමසනවනේ. කොණ්ඩෙ ලස්සනයි. ඇස්දෙක, දෙතොල, සිනාව කොපමණ ලස්සනද කියල රූපෙ ඇලෙන්ඩ බලනවා නේද.

රූපය කියන්නේ කැඩෙන බිඳෙන වෙනස්වෙලා යන දෙයක්නේ. නිත්‍ය බවක් නැනේ. දිරල පොලවට පස්වෙලා යන දෙයක්. ශබ්දයත් එහෙමනේ. ශබ්දය ඇහුණ ඉවරයි. ගඳ සුවඳත් දැණුන ඉවරයි. රසයත් එහෙමනේ. කරවල කැල්ල හරි රහයි කියලා අපි කියනවනේ නේද? නමුත් ඒ රස කරවල කැල්ලේ නෑ. ඒක අපේ සිතේ හට ගන්නේ. අපි කියන්නේ කරවල රසයි කියලා.

දැන් මල ලස්සනයි කියනවනේ. ඒ ලස්සන මැවිල තියෙන්නේ අපගේ සිත තුළ අපි කියන්නේ හරිම ලස්සන මලක් කියලා. බණ අහනවා කියලා දන්නේ හිතක් ඇති නිසානේ. කොතනද මේ හිත තියෙන්නේ අපගේ සිරුර තුළ, සිරුරෙ කොහෙද, හදවත ආශ්‍රිතව ලේ ධාතුව සමඟ ඇත්තේ එතකොට දැන් අපි බලමු මේ සිරුර තුළ තවත් ඇත්තේ මොනවද කියලා. කෙස්, ලොම්, නිය, දත්, සම තියෙනවා මේවා ලස්සනද? නෑ නේද? පිලිකුල්නේ මේ වගේ කුණු ගොඩවල් 32 ක් මේ සිරුරෙ තියෙන්නේ. මේවා ලස්සනද? පියකරු ද? නෑ නේද, එහෙනම් ඇයි මේවට ඇලෙන්නේ, රූපෙ ලස්සනයි. කියලා ඇලෙනවා. ඒක මටම ඕන කියනවා මගේ කරගන්න හදනවා. මේ සිරුර නනා ලෙඩ රෝග වලින් පිරිලා අනන්ත අපමණ රෝග, සමහර රෝග

වෛද්‍යවරුනට සොයා ගන්නත් නොහැකියි. ඒ විතරක් නොවේ අර ලස්සන කෙස් ලොම් සුදු පාට වෙනවනේ. ඒක තමයි සොබා දහම. ඒ සොබාදහම වෙනස් කරන්ඩ බැහැනේ.

කොණ්ඩෙ කළු කරනවා ඒත් කී දවසද? නැවත අර සොබාදහම මතු වෙනවා. හිතට දුකක්. ඇස් වල පෙනීම දුබල වෙනවා. දුකයි. කන් ඇසීම දුබල වෙනවා දුකක්. අතපය වල දැනෙන වේදනාව ප්‍රබලය. දනහිස් කැක්කුම තෙල් බේත් ගල්වල ඉවරයක් නෑ. නානා ලෙඩ දුක්, හේතු ප්‍රත්‍යයෙන්, සැකසුණ චේතනවෙන් පිලියෙල කළ විඳීමට වස්තුවක් වූ මේ ඇස පුරණා කර්‍මයක් ලෙස දකින ලෙස බුදුපියාණන් වහන්සේ දේශනා කළ සේක.

එතකොට මේ ඇස, කණ, නාසය, දිව, කය මේ පිසිඳුරන් පෙර කරන ලද කර්‍මයන්ගේ විපාකයන්ය. ඉතින් දැනුත් මේවයින් අප කර්ම රැස් කරමින් තමයි ඉන්නේ. හොඳ කර්ම, නරක කර්ම ඒක තමයි ඊලඟ භවයට යන්නේ.

අප සිරුර නිර්මාණය වී ඇත්තේ,

| | | |
|---|---|---|
| පඨවි | - | ආපෝ |
| තේජෝ | - | වායෝ |
| වර්ණ | - | ගන්ධ |
| රස | - | ඕජා වලිනි. |

මේ ශුද්ධාශ්ඨකයි. මේවා රූප 8 ක මිටි වශයෙන් තමයි ඇත්තේ. මේ ශුද්ධාශ්ඨක මිටියක් ඇසට නොපෙනෙන තරම් සියුම්. මේ ශුද්ධාශ්ඨක වලින් තමයි අපගේ සිරුර නිමවී ඇත්තේ.

ඒවට තමයි කියන්නේ රූප කලාප කියල. මේව අපගේ සිරුර තුළ බිඳි බිඳීඇති වෙනවා නැති වෙනවා. ක්‍ෂණයක් පාසා බිඳි බිඳී ඇති වෙනවා. මේක අපිට පේන්නේ නෑ. අපි කියනවා මෙතන කෙනෙක් ඉන්නවා. මම ඉන්නවා සතෙක් පුද්ගලයෙක් ඉන්නවා කියලා. නමුත් එහෙම එකක් නෑ. බිඳි බිඳී යන නාමරූප ධර්‍මයක් තමයි ඇත්තේ. මෙන්න මේක අප ප්‍රඥාවෙන් දැකිය යුතුය.

මේ රූපය සන්තති හා සමූහ ඝනයෙන් වැහිල නිසා අපිට ඒක පේන්නේ නෑ. සිරුරේ වෙනස්වීම, අපට පේන්නේ මේ සිරුර ඉපදිල පවතිනවයි කියලා. නමුත් මේ රූපය ක්‍ෂණයෙන් ක්‍ෂණය වෙනස් වෙනවා.

විඤ්ඤාණය ගර්භාෂයට බැසගත් පසු එතන කලල රූපයක්. ඒ රූපයෙන් රූපයක් හට ගත්තා. දින 77 ක් යන තෙක් මේ කලල රූපය වැඩෙන්නේ ඍතුවෙන්. ඉන් පසුවේ තමයි අර හිස් අත් පා සටහන් ඇති වෙන්නේ. දින 77 කින් පස්සේ තමයි ඒ රූපය මව ගන්න ආහාරයෙන් යැපෙන්න පටන් ගන්නේ.

මොන දුකක්ද? ගර්භාෂය ඇතුලේ ඉන්නව කියන්නේ. අඳුරු ජරා කුටියට වෙලා වකුටුවෙලා. මව සීතල දෙයක් ආහාරයට ගත් විට දරුවා සීතලෙන් වෙවුලනවා. උණුසුම් දෙයක් ගත්විට සිරුර පිච්චෙන වේගයක් දැනෙනවා. ඉතින් මේ දුක අපි දකින්න ඕනෑ කොහොමද ? විදර්ශන නුවණින්. තම රූපයත් බිඳි බිඳී යනවා. මේ ක්‍රමයට තමයි කාමලෝක රූප අරූප ලෝක වලත් ඇත්තේ. මේ කරුණු අනිත්‍ය දුක්ඛ අනාත්ම ලෙසට දැකිය යුතුයි. අල්ලා ගැනීමට කිසි දෙයක් නැත.


සිතක් කියන්නේ ක්‍රියාවක්. ක්‍රියාව කරන කෙනෙක් නැත. ඇත්තේ ක්‍රියාවලියයි. නාන සිත නාන්නේ කයයි. ඇවිදින සිත ඇවිදිනන්නෙ කයයි. මෙලෙස තම තමා තුළින් මේ අමා දහම දැකිය යුතුය. එවිට අප තුළ මේ කලකිරීම ඇතිවේ. සියලු දේ අනිත්‍යය. සිතද අනිත්‍යය.

අංගුලිමාල 999 ක් මිනිසුන් මැරුවා. අංගුලිමාල ඒ සියල්ල අනිත්‍ය ලෙසට දුටුව, රහතන් වහන්සේ කෙනෙක් උනා. අපි අපේ චුති සිතද අනිත්‍ය ලෙස දැකිය යුතුය. අපි තාමත් මේ සසර සාගරයේ ගිලෙමින් ඉන්නවා. මේවා නවතා ගත යුතුය.

මරණ මොහොතේදී චුති සිත අනිත්‍ය ලෙස දැක නිවන් දොරටුවට පිවිසිය හැකියි. සෝවාන් ඵලයට පත් වීමෙන් ඒ නිවන් දොර හැර ගත හැකිය.

**ආර්. පී. ඒ. ගුණසේකර (758)**
**033 222 466 2**





## වකුගඩු රෝගීන් වෙනුවෙන්....

කළයුතු දෙය කිරීමත්, ගත යුතු දෙය ගැනීමත්, දිය යුතු දෙය දීමත් ඉක්මණටම කළ යුතු බව සැබෑවකි. සුදුසු වේලාවේදී, සුදුසු ස්ථානයේදී, සුදුසු දේවල් සඳහා හැකි පමණින් පරිත්‍යාග කිරීම, උදව්කිරීම, දීම හෙවත් අතහැරීම කළ හැකි නම් එය මිල කළ නොහැකි සද්කාර්යයකි.

නොසිතූ විරූ ලෙස අප දිවයින පුරා දැවැන්ත ලෙඩ රෝග රැල්ලක් වර්ධනය වෙමින් පවතී. බෝවෙන වසංගත රෝග නොවුනත් හෘදයාබාධ, දියවැඩියාව, හදිසි අනතුරු හා වකුගඩු රෝග සමාජය පුරා ඉතිරී, පැතිරී, විසිරී යන්නේ වසංගත රෝග ව්‍යාප්තියක් මෙනි. මෙම රෝගීන් සඳහා හැකිපමණින් ආධාර උපකාර කරන ලෙස විවිධ අංශ මගින් අප සංගමය වෙත යොමුකරන ඉල්ලීම් දිනෙන් දින වැඩිවෙමින් පවතී.

එබැවින් දරුණු ලෙස ව්‍යාප්තවන අසරණ වකුගඩු රෝගීන් උදෙසා කිසියම් පරිත්‍යාගයක් කිරීමට අප විධායක කමිටුව තීරණය කරන ලදී. ඒ සඳහා ඔබගේ නොමසුරු ආධාරය (රු.500/- කින් පමණ) අප සංගමයේ ගරු භාණ්ඩාගාරික වෙත හැකි ඉක්මණින්ම ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

**"දෙන දේ රැව් දිදී සුවඳ දේ ! "**

**- විධායක කමිටුව -**


# සැඳෑව

**சந்தாவ**

**ශ්‍රී ලංකා**
**මහ බැංකු විශ්‍රාමිකයන්ගේ**
**සංගමය**
**2015 ජූලි/ අගෝස්තු.**



වෙබ් අඩවිය ඃ www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com

අංක ඃ QD/04/News/2015 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.



**ගරු ලේකම්,**
**මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,**
**116/2/1B, බෝ සමිඳු මාවත, දොලේකනත්ත,**
**මහරගම පාර, පිළියන්දල.**



රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.

සැඳෑව - සංස්කරණය
අමරපාල කරසිංහ ආරච්චි විසිනි.

Typesetting - **Graphicworld** - Panadura.
graphicworld.pan@yahoo.com
graphicworldit@gmail.com